# නිර්මල පූජා









දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

කතෘගේ වෙනත් කෘති :

- ❖ අපේ රෝස බක්කි කරත්තේ ( 2019 )
- ❖ මායා ගුරු ප්‍රණාමයට සුදු අරලිය මල් දෝතක් ( 2021 )
- ❖ රවුමක් යමු මාත් එක්ක ( 2023 )
- ❖ මා හද බිතුතල මායා හැඩතල ( 2025 )

මහ / මහාමායා බාලිකා විදුහල

සහකාර විදුහල්පතිනි

කෘතිය පළ කරන දිනය : 2026. 05. 10

ISBN : 978-624-211-495-8

# පිදුම

මහාමායා බාලිකා විදුහලේ වත්මන් විදුහල්පතිනිය වන
ශශිකලා සේනාධීර මැතිතියට,

නව වසක් සිසු දැරියක ව මා
ගෙවූ මහාමායා බිමෙන් ලද
දෙයක් වේ නම් යළි ගෙවන්නට
වරම් දුන්නේ ඔබයි මාහට....

සත්සරින් දිවි වෙණ සුමට කළ
පන්හිදෙන් මට මාව හිමි කළ
මේ බිමට යළි ණය ගෙවන්නට
මවෙත වූ කටු අකුල් බිඳ හැර....

වෙහෙස දරමින් කෙටි කලක් තුළ
සදා දී තැන් මාරුවක් මට
මට වරම් දුන් මහරු මිණ ඔබ
පහන් දල්වන්නට මනැස් තුළ...

දුරුර බාධක දිවිය දිනනා
මගයි ඔබෙ පොත කියන්නේ හෙට
මගේ ඇරයුම එළ දරා ඇත
ඔබේ නිර්මල හිත අවදි කර....

"නොහැකි" බව ඔබ පොත් ලියන්නට
හිස වනා දෙවරක් ම පෙර දින
කියූ ඔබගේ පුරාවත දැක
කඳුළු අතරින් සිනාවෙමි අද....

මසිත මැවූ මල් ලියකමින් නිති
අකුරු ගෙත්තම් මවා හැඩ කර
අමොද මහදින් ඔබේ සුරතට
තිළිණ කරනෙමි නික්ම යනු පෙර....

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදනම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණී ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දෑයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක් ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට  උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්ට මග පෙන් වූ ගුරුභවතුන්ට මෙන් ම නිර්මාණකරණයෙහි යෙදුණු ආචාර්ය මණ්ඩලය ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විදුහල,

මහනුවර.

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළද වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළද සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළද මාළිගාව
2026.05.10

# පූර්විකාව

**සිරි දළඳා පුස්තක පූජා !**

අනේක රෝ බියෙන් පෙළෙන
සලිත අනිත හුස්ම හෙළන
සසර කතර අතරමං වූ
ලෝ දනගේ සුවය පතමි

අනුන් පෙළන නසන රිසින
රුදු වූ සිත් මුදු කරවන
බුදු වදනින් දිවි සනහන
පසන් සියුම් ලොවක් පතමි

සෙංකඩගල අසිරිය මැද
උතුම් හේමමාලාව ගෙ
කෙස් වැටියේ සුරැකීගෙන
නෙක බාධා මැඩ පුද ලද

දළඳාවට අකුරු පුදමි
මහාමායා සිප් සාරෙන්
පොහොනි ව පිපි සිත් කුසුමින්
සුගන්ධමත් බැති හැඟුමින්......

# පටුන

## 1. මහාමායා බාලිකා විදුහල (1978 – 2026)

❖ අංකුර වියේ සන්ධිස්ථාන

01.අවුරුද්ද - **මිහිර පත්‍රයේ පළමු නිර්මාණය**

02. පොසොන් භක්ති ගීතය - 1980 (8 ශ්‍රේණියේදී)
03. අනුබුදු හිමියනි - 1981 (9 ශ්‍රේණියේදී)
04. නවෝදයක් බිහිවුණා - 1981 (9 ශ්‍රේණියේදී)
05. නොලියූ දුක් කව - 1984 (12 - B විද්‍යා ශ්‍රේණියේදී)

06. අමිල දායාදය - **මහාමායාවේ 75වන සංවත්සරය සැමරීම සඳහා**

07. ඇදුරු හරසර ප්‍රසාද ප්‍රණාම - 2013 දී 1982 ආදි සිසු කණ්ඩායම වෙනුවෙන්

08. මායා මාතා අභිවන්දන ගීතය (2017) - ගග අද්දර ගීතයේ තාලයට

09. මතක මංපෙත කෙටිව ඔබ වෙත සෙනෙහසින් .......

10. දරුවනි….

11. ලීලා නවරත්න විශ්‍රාමික සංගීත ගුරු මවට උපහාරය

12. "**ගත්කරණී**" පොත් ලිවීමේ වැඩසටහන සඳහා පිළිගැනීමේ ගීතය - 2024

13. ගණිත සංකල්ප සඳහා ළමා ගීයක් ගණිත කඳවුර - 7 ශ්‍රේණිය (2024)

14. සිසුන් සඳහා ගීතයක්

15. පිළිගැනීමේ ගීතය - *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය* -2022

16. පිළිගැනීමේ ගීතය - *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය* -2023

17. පිළිගැනීමේ ගීතය - *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය* -2024

18. "ගුරු ගෙදර" ග්‍රන්ථ කේන්ද්‍රය මගින් පැවැත් වූ (2024) දීප ව්‍යාප්ත "සඳ දිය මංකඩ ඇදුරු ප්‍රතිභා" සාහිත්‍ය සම්මාන උළෙලේදී කාව්‍ය අංශයේ කුසලතා ජයක් ලද නිර්මාණය - ඇදුරු සිතක මහිම

19. ස්ථාන මාරු ලද නි. විදු. හිමාලි සේනාධීර මිය වෙනුවෙන්
නිර්මාණය කළ උවසර ගීතය

20. වෙසක් ආසිරි පත් සදහා කළ නිර්මාණය - (2026)

20. එලදායිතා ගීතය (2026)

## සීතාදේවි බාලිකා විදුහල (2005 -2022)

21. **ස්වර්ණවාහිනී රූපවාහිනී නාලිකාව** මගින් සංවිධානය කළ වෙසක් බැති ගී තරගාවලියෙන් දෙවන ස්ථානය ලද ගීතය (2007)

22. සීතාදේවී විද්‍යාලයීය කුළුඹුල් කලා උළෙල - පිළිගැනීමේ ගීතය 2007

23. ගුරු වන්දනා තුති කුසුම් ප්‍රණාම

24. සීතාදේවී බාලිකා විදුහලේ 2013 දී මුද්‍රිත වෙසක්පත්
සඳහා මවිසින් රචිත කවි

25. English camp welcome song

26. Welcome song – Connecting classroom

27. සැබෑ සංහිඳියාව

28. ආශිංසන

29. පූජාච පූජානීයානං..........

30. රණවිරු උපහාර

36. ප්‍රීතිමත් ළමා දිනයක් !

37. නව නිර්මාණාත්මක වන්නම - මව්පිය සෙනෙහස

38. Annual English Day – Welcome Song (2012)

39. English Day – Welcome Song (2018)

40. ධරණීය සංවර්ධනය කරා.....

**<u>වෙනත්</u>**

41. 2007.08.02 දින මල්වතු විහාරස්ථානයේ පැවති වැලිවිට සරණංකර අනුස්මරණ උත්සවය සඳහා රචිත අනුස්මරණ ගීතය

42. අභිනවයෙන් පත්වන ලද උඩරට අමරපුර මහා නිකායේ මහනායක හිමියන්ගේ පිළිගැනීමේ උළෙල සඳහා වූ පිළිගැනීමේ ගීතය - 2017

43. වැව්තෙර ගිරිහිස - සැරදේ දම්රද - මහ/ ධර්මරාජ විද්‍යාලයේ 125 වන සංවත්සරය සඳහා පළ වූ සගරාව 2012දී

44. ලොව්තුරු සුව සොයා....

46. 1 වසර සිසුන් පිළිගැනීමේ ගීතය - 2026

47. මහ/ කිංග්ස්වුඩ් විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ පිළිගැනීමේ ගීතය

**<u>ගේය සංකල්පනා</u>**

48. මගේ මවගේ 80වන ජන්ම දිනය වෙනුවෙන් ලියූ ගීතය

49. පිනි වැස්සක් වී මව් නෙත.... (මහ/ චන්ද්‍රානන්ද විද්‍යාලයේ සිසු ඉල්ලීමකට)

50. එක ම දියණිය වෙනුවෙන් ලියූ ගීතය

51. පතිකුල පිවිසෙන දෝනිට.... (මිතුරියකගේ ඉල්ලීම)

**<u>ශාස්ත්‍රීය ලිපි</u>**

52. ළමා අයිතිවාසිකම් රැකීම සමාජයේ ප්‍රගමනය වැදගත් වන අයුරු

**(පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශය මගින් පැවැත් වූ මානව හිමිකම් පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන ලද ලිපිය)**

53. Importance of using visual aid for the teaching of English in primary classes

( The article submitted for the magazine published on behalf of Primary Education organized by **Gampola Zonal Education Office**)

# 01.අවුරුද්ද

රතු එරබදු මල් හිනැහෙනවා
කොහාගේ කටහඬ නද දෙනවා
රබන් ගහන හඬ පැතිරෙනවා
දූන් දූන් අවුරුදු ළඟ එනවා

චට පට චට පට ඩොං කියලා
රතිඤ්ඤා අලි ඩොං ඔංචිල්ලා
පුංචි අපගෙ සිත සතුටු වෙලා
කැවුම් කොකිස් කමු එකතු වෙලා

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

(ගම්පොල ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලයේදී 3වන ශ්‍රේණියේදී
1975 / 04 / 14 දින මිහිර පුවත්පතෙහි පළ වූ මගේ ප්‍රථම නිර්මාණය)

## 02. පොසොන් භක්ති ගීතය

මලින් පිරුණු පලින් නොඅඩු
සොඳුරු උදාවයි.....

සොඳුරු උදාවයි - සිරිලක

මිහිඳු මහිමයයි..... //

පොසොන් දිනේ සුපුන් සඳේ

කැලුම් විදාලයි....

සිසිල සදාලයි

මිහිඳු මහිමයයි.....

මලින් පලින්.......

මිස්සක පව් වෙතින් නැගුණු

දහම් ගීතයයි.....

සියොත් අසිරි චාමර මැද

දහම් ගඟ ගලයි....

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

තනුව හා සංගීතය - ඩබ්. එෆ්. විමලසිරි මහතා
(සංගීතාචාර්ය මහාමායා බාලිකා විදුහල)

(1980දී වාර්ෂික පොසොන් බැති ගී සඳහා සංගීතාචාරිනී ලීලා නවරත්න මහත්මියගේ ඇරයුමෙන් මහාමායා බාලිකා විදුහලෙහි 8 ශ්‍රේණියේදී මවිසින් රචිතයි)

## 03. අනුබුදු හිමියනි

අනුබුදු හිමියනි ඔබේ මහිමයෙන්
නවෝදයක් බිහිවුණා

නවෝදයක් බිහිවුණා මේ දෙරණත

නවෝදයක් බිහිවුණා

සාගර පරදන නිල්වන් වැව්තල
අවුකන තොලුවිල සමාධි ප්‍රතිමා

අහස උසට නැඟි රන්වැලි මහ සෑ

ඔබේ මහිමයෙනි බිහිවූයේ

අනුබුදු හිමියනි....

සීගිරි කැටපත් පවුරේ කුරුටු ගී

සිරිමා බෝපත් සැලෙනා සර මැද

සඳකඩ පහණක කැටයම් අතරින්

මැවේ ඔබේ රුව අනුබුදු හිමියනි

අනුබුදු හිමියනි....

රස කවි මතු කළ හෙළ සාහිතයයි

බොදු හඬ රැක දෙන ගී නාටකයයි

සැමදා පවතින සිහල උරුමයයි

හිමියනි ඔබහට සදා අප ණයයි

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

තනුව හා සංගීතය - ඩබ්. එෆ්. විමලසිරි මහතා
(සංගීතාචාර්ය මහාමායා බාලිකා විදුහල)

(1981දී වාර්ෂික පොසොන් බැති ගී සඳහා සංගීතාචාරිනී ලීලා නවරත්න මහත්මියගේ ඇරයුමෙන් මහාමායා බාලිකා විදුහලෙහි 9 ශ්‍රේණියේදී මවිසින් රචිතයි)

## 04. නොලියූ දුක් කව

ඔබ මළ පසු - සොහොන් කොතේ
දුක් ගීයක් ලියන ලෙසින්
සඳ වියැකුණු - තරු නොදිලුණු
පාළු - මිලින රාත්‍රියක
ඔබ සැතපුණු සුසානයට
ආවෙමි මම - කිවිඳුනි මහගමසේකර
ඔබේ අළු බඳුන වන් - නෙතට නොම දසුන් විය
නිසල ඔබෙ සොහොන් කොත
කඳුලකින් බොඳවීය
ජීවිතේ කිසිදාක මා නුදුටු ඔබේ රුව
දුටුවෙ ඔබ සුසානයෙ - තණ පලස මතින් නොව
ඔබේ හිත් උල්පතේ ඉපිද දෙවුරේ ගැලුව
පුපුරු ගසනා සත්‍යය මත නැගුණු ඔබ දුටිමි
දෙනෝදාහක් දෙනා අතරේ
මහා යෝධයෙකු සේ
'ප්‍රබුද්ධ 'ඔබ රුව පෙනේ මගෙ සිතට

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ
1984දී
12 – B විද්‍යා ශ්‍රේණිය - සිසු

(මහාමායා සෙවනේදී බාහිර තරගාවලියකින් ප්‍රථමවරට මවිසින් ජය ලැබූ ස්වයං නිර්මාණය)

# 05. අමිල දායාදය

විසුළ පිණි මුතු මතට - ළහිරු රැස් උදා වී
සිඟිති හසරැලින් මුව - විකසිත වූ උදෑසන
සීත වැව්තෙර හමන - පවනෙ රැඳි සිසිලසම
හදවතට තුරුළු කර - අත්වැල් බැඳන් එදා
නැවුම් හැඟුමන් සමඟ - පියනැගූ පා පොඩිති
හෙටද රොබරෝසියා පලස මත ඇදෙනු ඇති...

දිවයිනක වූ සතර ඉමේ සිට රොක් වෙලා
එක මවක දරු විලස සිප් කිරෙන් නැහැවිලා
ගුණ දහම් සඳක් සේ සිසු අඹර එළි කරලා
ජීවනයෙ සැබෑ සුන්දරත්වය හිමි කළා
සිසිල් පවනට සැලෙන කහ ඇසළ මල් වැලෙක
සුපිපි අරලිය මලෙක සුමුදු මුදු පෙති අතර
අප සුවඳ අතීතය - සැඟව ඉඟි බිඟි කරයි

අද හෙට ද මෙබිම මත - පිය තබන දියණියනි
එදා අප ළපටි විය - මෙදා පොඩි ඔබ සතුයි
සොම්නසින් ප්‍රමුදිත ව - බොදු බැතින් නිකසල ව
අද ගෙවන ඔබ දිවිය සඳකල් පිළිතුරුය

අතිර දේ ලොබ බඳින - මුදලට ම ලොබ බඳින
සරුව පිත්තල ලොව ම කසල බව දැන හැඳින
නිමල සුචරිතය රැකී - දිවියෙ හර කියාදෙන
සෙනෙහසින් ඔබ රකින - ගුරු මවත් ඇය ම වෙයි

සොඳුරු විය හැර පියා - පා තබන කටුක ලොව
නොහැර යන සෙවනැල්ල - ඔබෙ දෙවැනි මව ඇයයි
සියල්ලෙහි අනිත බව - මැද මගෙහි උතුම් බව
මායාව පසක් කළ - සදතන ධර්මයයි

නොසැලෙනා තිර මනස - චාම් බොදු දිවි පෙවෙත
දිවි පුරා ඔබ ලබන - අමිල දායාදයයි

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

(මහ/මහාමායා බාලිකා විද්‍යාලීය 75වන වාර්ෂික සැමරුම වෙනුවෙන් පළ වූ සඟරාව සඳහා ලක්ෂ්මි ජයතිලක ගුරුමවගේ ඇරයුමින් මවිසින් රචිත නිර්මාණය)

## 06. නවෝදයක් බිහිවුණා

නවෝදයක් බිහිවුණා - අමා දහම් ගඟ ගලා

දසරජ ධර්මෙන් රජ කළ නිරිඳුන්
වැසියන් හා දැහැමින් විසුවෝ
මිහිඳු අනුහසින් පිබිදුණු නව හිරු
කැළුම් විද දෙරණත වැඩියා

නවෝදයක් බිහිවුණා....

කළුගල් තැලුනා බුදු රූ නෙළුනා
තෙලිතුඩු අතරින් සිතුවම් ඇඳුනා
දියරැළි නංවා මහවැව් තැනුනා
විමුක්තියේ රන් දොර ඇරුනා

නවෝදයක් බිහිවුණා....

දගැබ් වෙහෙරෙන් ගතසිත නිවුනා
මෙත් සිලිලාරෙන් හදවත් තෙමුණා
සාහිත රතුකැට හෙලේ මතුවුණා
දහම් දිවයිනක් ලොවට බිහිවුණා

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ
තනුව හා සංගීතය - ඩබ්. එෆ්. විමලසිරි මහතා
(සංගීතාචාර්ය මහාමායා බාලිකා විදුහල)

(මහාමායා බාලිකා විදුහලෙහි 9 ශ්‍රේණියේදී සංගීතාචාරිනි ලීලා නවරත්න මියගේ ඇරයුමෙන් 1981දී රචිතයි)

## 07. ලීලා නවරත්න ගුරුමවට උපහාරය

දිදුළ සඳකි දුරු කළ තිමිරේ
මායා ගුරු අඹරේ
හසරැලින් මුදලූ ඔබෙ සෙනෙහේ
ගීයකි මිහිරි සරේ
ඇහැළ අරලියා සුපිපි බිමේ
ඒ සත්සර රාවේ
එද ගලාගිය අයුරු මැවේ

පොසොන් සඳේ මුදු කිරණ මැදින්
බැතියෙන් මන නඳනා
දූවෙන සිතට පිනි ඉසින ලෙසින්
මියැසි ගයා වැයුනා
සිසු දරු කුළුඳුල් ගී පබැඳුම්
පන්හිඳ අවධි වුණා
ගුරු මව්පියගේ ඒ මහිමේ
සඳ හදේ රැඳුණා

මියුරු හැඟුම් හද බිතු තලයේ
ඔබ සිත්තම් කෙරුවා
නේක වර්ණයෙන් අප ඔප වී
ලොවට පියා සැලුවා
සිඟිති කුසලතා විකසිත වී
සරසි සරණ ලැබිලා
නවරත්නයකී ගුරු මවුනි ඔබේ
අසිරියෙ මල් පිපිලා

නිදුක් නිරෝගී සුව වේවා
මහිමෙන් සිරි දළඳ
අපේ හදේ බැති පියුම් පිපේ
ඔබ සිහිවන සැමද
සංසාරේ අප යන ගමනේ
ඔබ හා පිය මැනලා
භවෙන් භවේ අපි මේ ලෙස හමුවෙමු
සෙනේ දමින් බැඳිලා

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
(සඳක් බැස ගියා අවරගිරේ ගීයේ තාලයට)

## 08. "ගත්කරණී" පිළිගැනීමේ ගීතය - 2024

නිල්වැව් තෙර ගිරි හිස මනරම් මහමායාවේ
කිතු මුතුහර හෙළ බොදු කුල කත පැළඳුවේ
පබසර රන්මිණි පහනක සේයා සම වේ
සපුරන සිප් නැණ යහගුණයෙන් දිවි ඔපවත් වේ

තිළිණ ප්‍රදනෙට සපැමිණි සුපසන් සිතකින්
ඉසිවරතුමනී ලොවට ම දුන් සුව සැනසුම්
පන්හිඳ ඔසුවක් සේමය එහි නැත විමසුම්
ඔබ සැම පිළිගමු අසෙනිය කුසුමන් ඉසුමෙන්

දස්කම් ලියලන ලා සිත් යායට ළහිරු රැසක් මෙන්
සොඳුරු සිතුම් නිති වපුළ බිමේ
රුසිරු දසුන් නෙත පිනන ඉමේ
දිරි සවි අපහට ඔබෙන් ලැබේ
ඔබෙ සෙනෙහස අප හදේ රැඳේ

සිරි දළඳ සරණයි
සැමට ම රැකවරණයි

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
තනුව - ශාන්ත ජයලත් තිසේරා මයා
(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)

'ගුරු ගෙදර' ග්‍රන්ථ කේන්ද්‍රය මගින් පවත්වන ලද 2024 දීප ව්‍යාප්ත "සඳ දිය මංකඩ ඇදුරු ප්‍රතිභා" සාහිත්‍ය සම්මාන උළෙලේදී කාව්‍ය අංශයේ කුසලතා සඳහා ජයග්‍රහණය ලද නිර්මාණය

## 09. ඇදුරු සිතක මහිම

ගසක වැල් එතී සසැලෙන දසුන මනහරයි
ගසට උරුම සවිය වැලට නැති බවත් සැබැයි
දිනෙක වැලේ පිපි කුසුමෙන් තුරු හිස් සොඳුරුයි
දිරි දෙන ගුරුවරු තුරුමය සිසුන් වැල් සමයි

නාය යද්දි ගුණ නැණ තොර දරුවෙකුගේ මන
සාප නොකර මෙත් මුදිතාවෙන් වීරිය ගෙන
ඉමක් නොදුන සරුංගෝල විලසින් පාවෙන
දරුන්ට නිසි මග පෙන්වන ගුරුන්ය අපමණ

රුදු අවි ලෝ වනසන සඳ ගුරු හද සසලයි
නිසරු සිතුම් දුරැර නිමල දරු මල් සනසයි
ඉසි කෝ මන් තොර සිත සෙත් පිරිතකට සමයි
හිස අත හදවත සරු කොට දෙස පණ නංවයි

මවා ගිරග චන්දන සිසිලස පාරාදීසේ
නිවා තාප සෝ ළතැවුල් සරතැස සන්තානේ
රාව නැගේ මියුරු සකුණු මියැසි සේ ප්‍රභාතේ
පාව ඇදේ ඇදුරු තෙපුල් දරු හිත් මල් යායේ

දූයේ ඉටු දෙවිඳු විලසින් සදකල් දිනේවා
රැයේ සඳු සේම තිමිරය සද දුරු කෙරේවා
අඳුර දුරලනා අරුතින් ගුරු තරු බිහිවේවා
සසර පුරා සුවඳ සදන ගුරු සිත් පිබිදේවා

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය

## 10. දරුවනි

පොතට සිතැති සිතක්
සිතින් රුවැති පොතක්
පිරුණු සිතත් වතත්
රන් මිණි වන් කමක්

නොවී වෙනත් අයෙක්
ඔබ ම වන්න ඔබත්
ඒ අදිටන් සිතත්
ලොවට ම සම්පතක්

ලොවෙන් සොයන යමක්
ඔබ තුළින් ම ලබන්
එම දිනයේ සිටන්
ඔබ පෝසත් සිතින්....

පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය

# 11. පිනි වැස්සක් වී මව් නෙත

පිනි වැස්සක් වී මව් නෙත මුතු කඳුලු
පින් සුවඳක් දී මුව හස මල් කැකුලු
ඒ මුතු පින්නේ මා තෙමුණා
මා හද දයාවෙන් මුදු කරනා
රහස ඔබ ම බව දැනුනා අම්මේ
ජීවිතයේ රස හඳුනා...

මව් සුලැඟිලි පහස පවා
සෙනේ තරංගයක් මවා
පිය තෙපුලක චමත්කාරයේ
අරුත රුවා
සියුමැලි වත-යෝධ බල සිත
සඟවා....
විසල් ලොවක් රුහිරු කිරෙන්
නුඹ සොඳුරු කළා

විඳී වේදනා සයුරට තුටු කඳුලු පා කළා
දිගු කළා ද නුඹෙ සසර ම මොළකැටි මුල් හැඩුම්
වැව් තලයක ගඟුලැල්ලක නැඟෙන රළ මත නොබිඳෙන
නොතෙමී දිදුලන-රන් සඳ නුඹෙ මුහුණ

පිනි වැස්සක් වී....

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැංගොඩ මිය
තනුව - චානක තෙන්නකෝන් මහතා
(චන්ද්‍රනන්ද විදුහලේ සංගීතාචාර්ය)
ගැයුම - නදුන් නිම්සර නිශ්ශංක
(10 වසර ශිෂ්‍ය)

(1200 views on YouTube, 114 likes & 94 comments)

❖ මහාමායා බාලිකා විදුහලේ ආචාර්යය මණ්ඩලයේ ක්‍රිෂාන්ති ජයවර්ධන ගුරු සොයුරියගේ ඇරයුමින් රචිත ය.

## 12. පතිකුල පිවිසෙන දෝනිට....

පිනි හිනැහෙන උයනෙ පිපුණ රෝස සමන් නෙලා රැගෙන
වැව රවුමේ ඔබ පෙර දින මව් සුරතේ දූවරී ගෙන
නිරන්තරේ පිය නගමින් දළඳ සමිඳුන් පිදූ හැටි
සොඳුරු සිත්තමක් සේ ඇඳුනා මා මනසේ අම්මේ...

මැදින් පෝය සඳ සිසිලස ගලා හැලෙන සඳඑතලේ
ඔබට මව් කියූ වදන ම අද මට කොඳුරයි මඳනල
යළිදු මැදින් සඳ පූදින දිනේ කුලගෙයට පිවිසෙන
මොහොත උදවන බව දන වියෝ ගිනි සිතේ ඇවිලින

බුදුවුන පෙර බෝසතුන්ට දූවරු හිමි වී සිටියත්
බුදුවුන භව ගිහි කළ දූවරු නම් හිමි නෑ
දුව හැර යන අබිනික්මන හිතට පහසු නෑ
අම්මේ සිත නිවා ගන්න ඔබට පහසු නෑ

මව්පිය තෙත් නෙතු දක සමුදෙන දින දුර නෑ
පෙරුම් දම් පිරුවත් අපි යළි සසරේ හමුවන්නට
බැඳුම් යදම් බව දත් ඔබ නිවන් මගේ සුවය සොයන
පාරමිතා මඟ පිවිසෙන දිනය දුරත් නෑ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය

(පාසලේ සමකාලීන සොයුරියක වූ සඳමාලි බාලසූරිය සොයුරියගේ ඉල්ලීමට අනුව 2025 මාර්තු මස සිදුවන ඇයගේ දියණියගේ විවාහය නිමිත්තෙන් රචිත ය)

## 13. මගේ මව්ට සෙනෙහසේ උවසර

සිත පිරිපුන් අත් පොතක් වගේ
වත සිසි කැන් මුදු සිලිල රුදේ
නෙත පැහැදුල් සෙනෙහසයි හදේ
අරුත විසල් දිවි පහනේ ඇගේ

තුඟු ගිරි හිස පවනැල්ලේ
සුව සිසිලස විඳිමින්
පැහැසර අරුණක විකසිත කුසුමකි
මගේ මවුන්

සුපසන් මනසින් දරු කැලකට දී සරු දැකුමන්
එඩිතර නිරවුල් ගුරු තරු මිණමය අභිමන්

සීත සඳුන් අරටු විලස
සිඳිත මඩිත සුවඳ විඳිත
පිළිවෙත් සරු පරපුරකට
ඔසු පැන් කලසක් විය
ඔබෙ ගුණ අම්මේ

නැණ මිණි මුතු සහසක්
ලෝ වෙත පිදුවා
ඒ මුතු පෙළහර සිරිසර
ඔබ දුටුවා

දිවි සලරුව රන් දියවර
සේ ගැලුවා
නිසංසලේ සැන්දෑ
ඉසිඹුව ලැබුවා //

සිත පිරිපුන්......

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
තනුව හා සංගීතය - රොක්සාමි මයා සහ ඇන්තනි සුරේන්ද්‍ර මයා

(මගේ මවගේ 80 වැනි උපන්දිනය නිමිත්තෙන් මා ලියා මගේ මල්ලි කළණ ඇරැගොඩ විසින් ගැයුවකි)

## 14. ඇදුරු හරසර ප්‍රසාද ප්‍රණාම

සදාදරණීය ඇදුරුතුමියනි....

මේ සුවිසල් ලෝ තුළ

යම් තැනෙක වේ නම් අප අද

ඒ ඔබ පෙන් වූ මං පෙත් ඔස්සේ...

පියමං කළ නිසාමය...

වේ නම් යහගුණ අප තුළ

ඒ ඔබ අපට හිමි කර දුන්

අමිල වූ සාර සිප් දයාදයන්මය...

ඔබ වපුළ සරු බීජ එල දරා

අප හදවත් සුසුවඳ මල් සේ විකසිතය අද...

අවසරයි... ඒ කුසුම් කැන් පුදා

ඔබ පා නමැද....

දළඳ සමිඳු සරණින්

ඔබට නිරෝගී නිදුක් සුව පතන්නට

දයාබර සිතින් - සසරේ යළි හමුවන්නට

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

(මහාමායා 1982 ආදි සිසු කණ්ඩායමේ ආදි සිසුවියකගේ ඉල්ලීමකින් ගුරු උපහාරයක් සඳහා 2013දී මවිසින් රචිතය)

15.මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ ගණිත සංකල්ප සඳහා ළමා ගීයක්

ගණිත කඳවුර - 7 ශ්‍රේණිය ( 2024/2025 )

පාට පාට මල් පිපී - සුවඳ උයනෙ පොඩි අපි

සුළං රැළේ හැපි හැපී - හදමු ගණන් නොම කිපී

රෝස පඳුරේ මල් පහයි - ඉද්ද ගහේ මල් අටයි
නෙළුම් විලේ මල් තුනයි - සේර ම මල් දහසයයි

අඩු කරමුද රෝස මල් - සමඟ නෙළුම් විලේ මල්
කීයද දැන් ඉතිරි මල් - ඔන්න හරිද පහයි මල්

බුදුන් පුදට ඕන මල් - අපට අඩු ව තිබුණු මල්
අපි ම බෙදා ගනිමු මල් - පිපෙයි හිතේ සතුටු මල්

මුහුදු වෙරළෙ දිව යමු - සිප්පි කටුත් සොයනෙමු
තිස් පහක් ම ඇහිදිමු - පස් දෙනා බෙදා ගමු

පහ හතෙනුත් හත පහෙනුත් - වැඩි කළ විට තිස් පහයි
එක් කෙනෙකුට කීයද - හතක් ලැබුණි කෙනෙකුට

පේර ජම්බු අඹ ඉදී - අතු පුරා ම ගෙඩි හැදී
සැමට සම ව බෙදාදී - සැවොම තුටින් රස විඳී

කෙනෙකුට අඩු වැඩි නොවේ - සමාන ව ම බෙදුවේ
ගණිතෙ එයට උදව් වේ - විනෝදයෙන් නිමාවේ

එකතු කර හොඳම දේ හැම දෙනට - වැඩි කරමු නැති දේ ම හැම දෙනට
වැඩි තැනින් බෙදමු අපි අඩු තැනට - ගණිතයෙන් පාඩමක් ගමු අපිට

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ

(ගණිත අංශ ප්‍රධාන චාරුක ගුණතිලක ගුරු මහතාගේ ඇරයුමින් රචිතයි)

## 16.සිසුන් සඳහා ගීතයක්

පිරිමි - මා කවුදැයි නොම පවසමි දැන ගැනුම ඔබට පවරමි

ගැහැණු -ගී කවි රූ කැටයම් මනරම් - ඔබෙ සිත සේයාදෝ විමසමි

පිරිමි - සිහින පැතුම් අත හැරියොත් - කුමක්ද ඉතිරි ව ඇත්තේ

ගැහැණු -වත්මන් මොහොතයි ජීවිතයේ - දිරියෙන් ජය ගත යුත්තේ

පිරිමි - මිනිසා සඳ දුටුවේ පස් තුළ - නුදුටුවෙ අසිරියමයි සක්වල

ගැහැණු -පා ගමනෙදි දුටු සුන්දර දේ සුවඳින් සිත් මල් විකසිත වේ

පිරිමි - චමත්කාරයෙන් රස ජනනී - මහෝඝයකි දිවි මන නඳනී

ගැහැණු -සත්ජන ඇසුර ම වේ රමණී - සඳහම් වේ අංජලිකරණී

පිරිමි - පහන් සිලක් වෙමි ඔබගේ හද සෝ තිමිරේ දුරු කරනා

ගැහැණු -පළිඟු මිණක් වී මා සිත මෙත් සිලිලාරේ පිරිමැදෙනා

පිරිමි - වස්දඬුවක් වී මහදේ මියුරු ම රිද්මය ඔබ වයනා

ගැහැණු -ගීතය වෙමි ඔබෙ පිවිතුරු හද වෙණසර අනුව ම මා ගයනා

පිරිමි - ඔබෙ දෑසෙන් මගෙ කඳුල ගිලිහුනා

ගැහැණු -මහද අමොද ඔබෙ පොපියන ලවනත රැඳුණා

පිරිමි - නොපිරුණු සිත තරගයේ මුලාවේ සැනසුණු සිත නැළවෙයි මිහිරේ

ගැහැණු -විදුරුමිණක් සේ හදවත් දිලුණේ සොඳුරු ගුණැති මනුදම් අප ළංකෙරුවේ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය

(2026 මහනුවර මහාමායා බාලිකා විද්‍යාලීය කලා අංශයේ කලා සංගමයේ ඉල්ලීම මත රචිතයි)

## 17. පිළිගැනීමේ ගීතය

පූදින කැකුලින් සුපිපේ කුසුමන් - දිගු නදී සැදේ ගලනා ගඟුලින්
දළු පැළ සුවිසල් වනස්පතින් වී - පිපි මලින් පලින් සිහිලැල් සෙවනින්

දස්කම් ලියලන ලා සිත් යායට - ළහිරු දහර ආසිරි වරුසා ලෙස
සපැමිණි ඔබ සැමට ම පළඳමු අප - සෙනෙහසින් තැනූ හරසර මුතුහර

පාසර මනසින් සිත්මල් පුබුදන - සරසවි මහැදුරුතුමියනි සුලකල
හරබර දැක්මෙන් සිත් සුපසන් කළ - පහන් ටැඹකි ඔබ තිමිරය දුරු කළ

සුන්දර පේරාදෙණි සරසවි තුළ - සරු මියුරු තෙපුල් සිසු හද බිතු තල
නදීශානි නාමය සිත්තම් කළ - ප්‍රහර්ෂවත් මහැදුරුතුමි මනකල

සිප් සාගර තරණයට පිය නගා - කෙළි මඬලේ සුරු විරුකම් පාලා
රැඟුම් වැයුම් මියැසියෙන් තෙලිතුඩින් - විදුමව් දිදුලමු දිරිමත් වීලා

සිඟිති කුසලතා විකසිත වන්නට - උදර හැඟුමින් රට නංවන්නට
ළබැඳි සවිය වී විවරණ දෙනු මැන - ආදර ගුරු දෙගුරුන් හා ඔබ සැම

පද රචනය - දිල්රුකා ඇරැගොඩ
නියෝජ්‍ය විදුහල්පතිනිය
මහ/ සීතාදේවී බාලිකා විදුහල

තනුව - මල්ලව රාජපක්ෂ මහතා
(සංගීතාචාර්ය -කිංග්ස්වුඩ් විදුහල)

(කිංග්ස්වුඩ් විදුහලේ 2020 ප්‍රාථමික අංශයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ පිළිගැනීමේ ගීතය )

## 18. පිළිගැනීමේ ගීතය

**මහ/ මහාමායා බාලිකා විද්‍යාලයීය *වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය -* 2022**

නිල් වැව්තෙර ගිරි හිස මනරම් මහමායාවේ
කිතු මුතුහර හෙළ බොදු කුල කත පැළඳුවේ
පබසර රන් මිණි පහනක සේයා සම වේ
සපුරන සිප් නැණ යහගුණයෙන් දිවි ඔපවත් වේ

තිළිණ ප්‍රදනෙට සපැමිණි සුපසන් සිතකින්
මහැදුරුතුමියනි සිප් සෑදූ මායා පියසෙන්
ඔබ සැම පිළිගමු අසෙනිය කුසුමන් ඉසිමින්
දස්කම් ලියලන ලා සිත්යායට ළහිරු රැසක් මෙන්

සොඳුරු සිතුම් නිති වපුළ බිමේ
රුසිරු දසුන් නෙත පිනන ඉමේ
දිරි සවි අප හට ඔබෙන් පිදේ
ඔබෙ සෙනෙහස අප හදේ රැදේ

සිරි දළඳා සරණයි///
සැමට ම රැකවරණයි

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
තනුව හා සංගීතය- ශාන්ත ජයලත් තිසේරා මයා
(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)

## 19. පිළිගැනීමේ ගීතය

*වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය* -2023

මායා මායා මායා මහාමායා

අප හද බිතුතල මායා හැඩතල
රූ සිත්තම් කළ විදුමව් සුළකළ

දිදුළන තරුමිණි අප ඔබගේ දියණියන්
සිප්නැණ යහගුණ සපුරාලන පිරිපුන්
තිළිණ ප්‍රදනෙට අමිල සොම්නසින්
සපැමිණි සැම පිළිගනිමු සෙනෙහසින්

සපැමිණි ඔබ සැම පිළිගමු සතුටින්
සිරි දළඳ සරණින් පිළිගමු සිත් බැතියෙන්

මායා මායා මායා මහාමායා

චමත්කාර පේරාදෙණි සරසවි
සිත්හර බර දැකුමෙන් සුපහන් කළ
සරු සිප්විල මහාමායා
පිරි පියුමකි මනකල්
මහැඳුරුතුමිය
අසිරි ලබා ගුරු දෙගුරුන්
සිතේ තබා දිරි සවි දුන්
විසුල ප්‍රභා මවන සොබා
තුමුල සභා නොම පසුබා//

මායා මායා මායා මහාමායා ///

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය

තනුව හා සංගීතය- ශාන්ත ජයලත් තිසේරා මයා

(කටුගස්තොට අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යක්ෂක)

## 20. ත්‍යාග ප්‍රදානෝත්සවයේ පිළිගැනීම් ගීතය - 2024

අප හද බිතුතල මායා හැඩතල
රූ සිත්තම් කළ - විදුමව් සුලකල
දිදුලන තරුමිණි අපි ඔබගේ දියණියන්
සිප් නැණ යහගුණ සපුරා පිරිපුන්
තිළිණ ප්‍රදානෙට අමිල සොම්නසින්
සපැමිණි සැම පිළිගනිමු සෙනෙහසින්..... //

චමත්කාර පේරාදෙණි සරසවි - සිත් හරබර දැකුමෙන් සුපහන් කළ
මහැදුරුතුමි පිපි පියුමකි මන කල - සොඳුරු මහාමායා සරු සිප්විල

මියුරු කලාවෙන් විසුල ප්‍රභා - ඉසුරු අනාවන් මවන සොබා
සුහුරු විදු නැණින් තුමුල සබා - නුහුරු නොවී සුදිලේ ය නොබා
දිරි සවිබල සිසු සිතේ තබා - ගුරු දෙගුරුන්ගේ අසිරි ලබා

සැමට ම සුවසෙත් වේවා මහිමෙන් සිරිදළඳා
සැනසුම් සුව ඉතිරේවා මහිමෙන් සිරිදළඳා

පද රචනය - දිල්රුකා ඇරැගොඩ
සහකාර විදුහල්පතිනිය
මහ/ මහාමායා බාලිකා විදුහල

තනුව - ශාන්ත ජයලත් තිසේරා
සංගීතාචාර්ය
මහ/ මහාමායා බාලිකා විදුහල

### 21. එලදායිතා ගීතය - මහ/මහාමායා බාලිකා විදුහල

පැහැසර අරුණක විකසිත කුසුමක සුවඳ ලෙසින්
තුගු ගිරි හිස පවනැල්ලේ මුදු සිසිලස විඳිමින්
නිරවුල් මනසින් සංවිධිත ව අපි සුපිළිවෙළින්
පිවිතුරු ව ම සමමිතියෙන් වෙමු ශික්ෂිත දරුවන්

කියැවීමට පොත ඇසුරට මිතුරන් අඳින ඇඳුම්
සුභාෂිත වදන් මියුරු මියැසි සිතුවම් රැගුමන්
පෝෂණයට නිසි අහර මනස හරබර දැකුමෙන්
නිකසල වෙමු හැරදා හිස් කේලම් පුරසාරම්

නිසි දේ නිසිතැන බැහැර කරමු අපි අනවැසි දේ
හරිත දනව්වක තිරසර සැනසුම සතුට රැදේ
උකුසෙකු විලසින් පියාසලා නිති නැවුම් වෙමු
මහමායා විදුමව්ගේ අබිමන රැකගනිමු.....

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
( සහකාර විදුහල්පතිනිය )

## 22. වෙසක් ආසිරි

සොඳුරු ගුණ නැණ සදිසි පබල හිරු කිරණ වී
අඳුර දුරලන සුපුන් සඳක් සේ සුමුදු වී
පිවිතුරු ම අරලියා මලක සුසුවඳ රැඳී
අමයුරු ම වැව් පවන් සිසිලසින් පණ පෙවී
මියුරු මියැසියක රග සොබා සිතුවම් විඳී
වියරු යුද ලොවක මෙත වපුරනා කවක් වී
තිලෝගුරු බුදු දමින් තුන් සිත ම පැහැද වී
දිනේවා මහාමායා දියණි සඳක් වී...

කවි පබැඳුම - සහකාර විදුහල්පති දිල්රුකා ඇරැගොඩ මිය
සිතුවම - සවිද්‍යා රෙහන්සා හරසරණි සිසුවිය (8-B)

------------------------------------------------------- විසින්
------------------------------------------------------- වෙතට

(2026 මැයි මස)

මහාමායා බාලිකා විදුහල,
මහනුවර.

## 23. මතක මංපෙත කෙටිව ඔබ වෙත සෙනෙහසින් .......

අතීතයේ සොඳුරු දිනෙක චූටි කාලෙ
අයියා - මල්ලි මා එක්කල අප්පච්චී
වැව රවුමේ කාර් රේස් නරඹන්නට නුවර ඇවිත්
වැව් ඉවුරේ කඳු බෑවුමෙ ඉන්නා අතරේ
මල්වැට අද්දරින් පෙණුනු පාසලකට අත දිගුකර
"ආන්න දුව ඔයා කවද හරි යන ඒ ඉස්කෝලේ!"
කියල පෙන්නුවා මතකයි හීනෙන් ගෑ සුවඳක් සේ
සිඟිති හිතට පැතුමක් දී....

ඉතින් කාලෙ ගතවීලා - ශිෂ්‍යත්වෙන් සමත් වෙලා
මගේ මුල්ම පාසල වූ - සෙන්ට් ජෝෂප් බාලිකාවෙ
සැමගෙන් සමුගෙන - ගම්පොල සිට මායාවට ආවේ
ජයනි - සමුද්‍රා සමඟින් පාසල් බස් රියෙ සතුටින්....

අදිකාරම් ගුරු මවගේ 6 A ඉතිරෙන විටදී
මීගම්මන ගුරු මවගේ 6 D හැදුණා අපටම
'ශ්‍රවණාගාරේ දූන් තැන' හය පන්තියෙ අපි හිටියේ
සංගීතේ හැදෑරුවත් සුන්දර සිත්තම් විඳින්න
ආට් ටීචගේ පන්තියෙ දූලෙත් එල්ලුණා හැමෝම

දුඹුරු දස්පෙතියා මල් පිපිලා තිබුණා මිදුලේ
ගණන්වලට ලකුණු අඩු ව දුකින් ඉන්න විට ලක්මිණී
"ඒයි ලකුණු පෙන්නන්නේ කොහොමද අපි ගෙදර ගිහිං?
අපි දෙන්නා අර මල් කාලා මැරෙමුද? ඒවා වස!
"බෑ අප්පා අපරාදෙනෙ ගණන් හින්ද ඇයි මැරෙන්නේ?
අනිත් වැඩට හොඳට ලකුණු තියෙනවානෙ මේ බලන්න"

ඔන්න අපේ බොළඳ වියේ රස මුසු වුණු ළාමක බව
සිනාගෙනෙන ඒ වග දූන් ලක්මිණීට අමතකමුත්
ඒ මල් අනුභව කෙරුමට නිල්මිණීටත් සිත් වූ වග
දෙතිස් වසක් ගෙවා ළඟදී එංගලන්තෙ ඉඳල ආපු
ලංකානිට මතකයිලුනෙ හරිම පුදුම ඒක නේද?

උදෙන්ම සවනත විදුහල්පතිනිගෙ ගැඹුරැති දම්පද
අප ව හැඩගැසූ ලලිතා ප්‍රනාන්දු මැතිනිගෙ ගුණකඳ!
වන්සේකර මව කරුණාරත්න මවත් කරුණාබර
අපගේ ගුරු මව් පියවරු වී නැත පොඩි අප හට දුර...
පන්තියකින් පන්තියකට නිකරුනේ ම සමත් නොවී
පුංචි අත්දැකුම් සැමරුම් ඉගෙනුම හා බැඳී තිබිණ
අද දිනයෙත් මා සිසු පරපුර ඇසුරේ රැඳෙනා කල
අප ආ මග සිහි කැඳවයි ඒ මායා හැඩ රූ තල
කුලුණු ගුණේ උල්පත වූ රණවාරණ ගුරු මව් මුව
රැඳුණු සිහල බස රසවිඳ ගැදි පැදි රචනෙට ලොල් වී
හැම වසරෙ ම සිහල බසට මුල් තැග්ග හිමි විය මට

සතියේ හැම සිකුරාද ම සමිති වාර හැම එකට ම
"නාට්ටියක්" අටවාගෙන අනේ අපට තිබුණු ගාය
රඟ දක්වල පෙන්වන තුරු අපි ම ලියපු අත්පිටපත්
ලක්ෂ්මි ජයතිලක සුසිරි සිරිවර්ධන ගුරු මව්වරු
සමිතියෙ අපි කළ දේ ගැන විවේචනය කරන විටදි
ආඩම්බර ලොකු සතුටක් පුංචි අපිට දිරියක් විය
ප්‍රියංවද "සිංහබාහු" අපි ඇල්ලුව කෝරස් එක
"නව නළු රස" නව දෙනෙකුගෙ
මා වාදකයෙකු වූයෙමි
සාකච්ඡා තිම්පුවෙ තිබූ උදේනිලා මල්ජි සමග
කාන්ති යුද්ධයටම ලැදි වී හරබර විය රැගුම ම
අවලා රවුන්ඩස් ;ගැහුවා පිට්ටනියේ බොහෝ විට ම
පුන්‍යා පොත් කියවූවා ශක්ති සමග බර බරේට

මේ කාලෙදි විද්‍යාවට පරිසර දින පොත් ලිව්වේ
පැෂන් වැලක බට්ටිච්චි කුඩුවක විත්ති මං දුටුවේ
පොඩි මැණිකේ ගුරුතුමියට මා ලිව් කතු හිත වැටුනේ
හැම බුද දින මා රැගෙන ම පේරාදෙණි සරසවියේ
වෛද්‍ය පීඨයේ තිබුණු විද්‍යාඅභිවර්ධනයේ
පාසල් සිසු සටහන් අප මුවින් ම කියවන වේලේ
මගේ ' බට්ති කුහුඹු පුවත්' විද්වත් සබ පිනවූ බව
'GOOD WRITER නෙ' කියමින් මට
මහැදුරු බස්නායකයන්
පැසසූ විට තුටු වූයෙමි ගුරු මව හා අහිංසක ව.....

තවත් දිනක 8 වසරෙදි සංගීතය පාඩමේදි
'මද්දුම බණ්ඩර කුමරුට' මගේ කවිය
මිහිර පතෙහි දුටු ලීලා නවරත් මව මා දෙස ආදරෙන් බලා
එවර පොසොන් බැති ගීයක් ලියනා ලෙස පැවසූ දිනේ
මට නව ලොව විවර වුණේ ඒ දුන් අත පුංචි කාලෙ
අද දවසෙත් තදින් වෙලේ ඇගෙ දියණිය මෙබිම නිසා
ඇත මිහිරි යුගයක් වෙත මගෙ සිතුවිලි යළි පාවේ
සඳකැන් පිනි දිය ගලනා පොසොන් දිනේ නිශා යාමේ
සඳුන් කපුරු සුවඳ මැදින් පහන් වැටක් එළිය වුණේ

ළමා සාරියෙන් සැරසි සුරත දරා සුදු අරලිය
එළිමහනේ වේදිකාවේ ගැයුවෙමු බැති ගීත නිතින්
මල්කාන්ති ලිලන්ති අක්කා මියුරුව ගී ගැයුවා
තනූජා අක්කා නිරතුරු සිතාරෙ තත් හැඩවූවා
නිමල් අරියරත්න - විමලසිරි ගුරු පියවරු දෙදෙනා
කිවි ලෙස බැති ගී ලිව්වෙමි හැම වසරෙ ම පොසොන් මස දි
ඔහුගෙ ස්වර තනු හැඩ කළ මගෙ ගීත ද නිති ගැයුවෙමු
'මේ බටු ඇට කෙල්ල හපන්!' ඔහු නිතර ම පැවසූ විට
මා සිතුවේ මිටි බංකුව මත මිටි මා නැගී නිතර
බැති ගී ගැයු හින්ද තමයි එසේ කියන්නේ කියලා

ගීත පුහුණු වී හැමදා වැවරවුමේ දෙපිය නගා
මුමුණ මුමුණ බැති ගීත ම හුදකලාව මා ගිය හැටි
අදත් වැවරවුමේ යන විට මගෙ මතකෙට පිවිසෙනවා
නෙත කඳුලින් බරවෙනවා අතීත සුවඳට නතු වී
අම්මයි අප්පච්චියි ආ දිනකදි බැති ගී අහන්න
මගේ නමින් තුති පිදුණා පොඩි හිත සතුටින් පිපුණා
සිඟිති දූරියකට මායා මවුන් වුණා තෝතැන්නක්
ණයගැති වෙමි එදා එසේ පිරිනැමු මහ පන්නරයට

'මොකද අනිත් වැඩට තැගි ගන්නවනම් ගණන් බැරිද?'
අලුත්ගමගෙ ගුරු මව් මුව දෝස් මුරය අමතක නැත
ප්‍රමේයයක් මට වැරදී "උඩ 9 යේ පංතියේ සිට
පහළ ජේන 8 වසරට අත අරිනවා මං උස්සලා"
සඟවාගත් කරුණාවකි යොමුකලේ ඈ කුඩා අපට
පසුකාලෙක ඒ ගුරු මව මගේ දියණිය ළදරු කාලේ
මාහට සේවය කෙරුමට පහසු පාසලක් ලැබුමට
කළ උදව්ව මතකයි මට තාමත් අද එදා මෙන්ම
අද සයුරින් ඈතක සිටිය ද මේ තුති මව්නි ඔබට

කෙස් රොදවත් අවුල් නොවූ වයිසුන්දර මව්ද තව ද
ගුණසේකර - කුමාරි - මාලනි - හේරත් ගුරු මව්වරු
මොණරාගල - බුලංකුලම - තැම්ණිමුල්ල - රන්පටබැඳි
කුලතුංග - නුගවෙල - පෙතියාගොඩ - ඇල්ලේපොළ මව්වරු
කරලුවින්න - ගුණවර්ධන - ගුණරත් අප ගුරු මව්වරු
කෙළි රැජින වූ මානෙල් මව් චීනෙන් ආ චුන්චි ටීචර්
රාජපක්ෂ මව්ගෙනි ලී කෙළි හරඹෙත් කුලුනැටුමත්
ELOCUTION TONGUE TWISTERS
අබේකෝන් ගුරු මැණිත් සුජාතා සිල්වා මැණිත්
අමරසේකර මවගේ පියානෝව අනුව යමින්
COUNTRY DANCE වල ම රැඳුණු බව මතකයි තුටින් එදා

සුමිත්‍රා ටීචර්ගේ සමාජ අධ්‍යයනය විය ප්‍රියතම
රූප කපා හැඩ කළ ක්ෂේත්‍ර පොත සිතියම
පුංචි වියේ අපගෙ ජීවිත හැඩ කළ හැටි මතකයි

අබේවික්‍රම ටීචර් දිනක් සොබාදහම් සිසු හවුලක්
ඇරඹූ විට මුල් ම පිරිස ලෙසට අපිත් එකතු වුණා
දිනෙන් දින ම නව තුරු වැල් මායා බිම පුබුදු කළා
අයිරාංගනී සේරසිංහ මැතිනි දිනක් එහි ආවා
විද්‍යා පන්තියෙදි අබේවික්‍රම ටීචර්ගේ මිහිරි බැනුම්
ඇසුමට මංද මං ඇයි ඒතරම් ම කැමති වුනේ
කිරිපැණි පළතුරු සලාද හිමකිරමත් කාටත් නැති
මහාමායාවට පමණක් තිබෙනා රසවත් දේ නිති
වෙන පාසැල්වල නැති සැප ගැන කිව්වේ ඒ ලෙසටයි
අපේ උනන්දුව මදි විට ජප මන්තරයක් විලසට
ඇය අදටත් F.B .හිඳ අපිට පහන් තරුවක් වෙයි
අනේ ඇත්තටම මේවා සසරේ බැඳුම් කියා සිතෙයි!
හේලීගේ වල්ගා තරුවත් නැරඹුවේ රෑ කඳවුර තුළ
සුදු රෙද්දක් ඇඳ හොස්ටල් දෙසින් හොල්මනක් විලසින්
ඇවිදින රුව අපි බැලුවම එතුළ සිටියේ අපේ නිල්මිණි!
රස විඳ විඳ අයිස් ක්‍රීම් රෑ 12 ට අනේ අපොයි!
ලලනි චන්ද්‍රිකා මල්ලිකා චම්පි කලානිලා සමඟින්
ගී රස විඳි යුගයකි එය තැනක් වෙලාවක් නැති ලෙස
ගඟවැරැල්ල වැට අද්දර පියගැටපෙළ මත ඉඳගෙන
අමරදෙව්ට ප්‍රිය කරමින් බාල ගීත අත හරිමින්
ළමා වියෙන් යොවුන් වියට එබිකම් කළ හැටි මතකයි

මඩොල්දූව හඳයා ගඟ අද්දර හා ගැහැණු ළමයි
රෙබෙකා - මයි ෆෙයා ලේඩි හා සිතුවිලි බැඳී තිබිණ
පුස්තකාලේ පොත් පිටු තුළ මට සේකරයන් හමු විය
'නිමක් නොමැති කොටාරමකි - ළමා වියේ ආස්වාදෙ'
එලෙස කිව් කේ. ජයතිලකයන් ද මායාවට පැමිණියේය
ඔහුගේ මහගු පොත් රැගෙනම
දිනක් සුසිරි ගුරු මව් හුදකලාවේ බංකුවේ ඉඳගෙන
සිටින විටක දිව ගියේ අප උසස් පෙළට පිවිසි අලුත
"හරියට වැඩ අපට අනේ ලියන්නවත් නෑ වෙලාව
ගීත කවි ද කෙටි කතා ද මට නම් දූන් අනේ ටීචර්"
මා පැවසූ පසු ඈ දුන් පිළිතුර මතකයි තාමත්
'ඔයා අහල තියෙනවාද - අමරසේකරව ගුණදස්?'
'ඔව් ඔව් පොත් ලියන හොඳට මහැදුරු වෙදතුමානෙ ඒ'
'ඉතින් දරුවො දත් ගලවා ගලවා හිටියොත් හැමදම
එතුමා ලිව් ලස්සන පොත් ලියන්නෙ කවදද කොහොමද?'
ඒ මගෙ හැරවුම් ලක්ෂෙකි ගුරුතුමියනි ඔබගේ හඬ!

යළිදු පුංචි පොත් ලිව්වෙමි - ඒ පොත් හිටගෙන කියවපු
පාසැල් බස් රියේ හිටිය මගේ පාඨක අක්කලාට
මිල මුදලින් බැහැ මනින්න අපමණ වූ රස සැමරුම්
අවසන් වසරෙදි පාසැල් යුගයේ මිතුරියො කී ලෙස
ගැයූ ගීයක වූයේ 'අප මින් මතු නැත හමුවන්නේ' ලෙස
ඉකිබිඳිමින් ඒ ඇසූනම නිල්මිණි හැඬූ හැටි මා දැක
පසු දිනකදි දූන ගත්තෙමි කුමටද එතරම් ඇගෙ දුක
'යළි කවදාවත් නිල ඇඳුමෙන් මේ මායා බිම තුළ
අප මින් මතු හමු නොත්වනා බව සිහි වී මට හැඬුණා'
ප්‍රියයන්ගෙන් වෙන්වීමත් අප්‍රියයන්ගෙ එක්වීමත්
බුදු වදනේ සත්‍යය දූන් වැටහෙයි පරිණත අපහට......

ඉහළින් සා.පෙළ සමත් ව උසස් පෙළට පියමං කර
උද්භිද භෞතික විද්‍යා සත්ව රසායන විද්‍යා
තෝරාගෙන නව තෙමහල විවෘත කළ දින තිබුණේ
අප දැතින් නිමැවුම් කළ ඒ විද්‍යා ප්‍රදර්ශනේ
ලීලනන්ද - වික්‍රමසිංහ - සෙල්වරත්නම් ගුරු මව්වරු
නානායක්කාර මවත් විදු විෂයන් ඉගැන්වූයේ
අංශය භාර ව නාරම්පනාව ගුරු මව් හිටියේ
බදුගේ - සිරිවීර - චිත්‍රමාලා - භාරතී මව්වරු
මෙන් ම සුමනසේකර මව්වරු දෙපලකි විදුබිම සිටි

රත්නතිලක සමරසිංහ ගුරු මව්වරු ශිල්ප සැදූ
ජයවර්ධන - බොකලමුල්ල ගුරු මව්වරු ඒ කාලේ

විවිධ දිශානති දෙස පාසලෙන් පසු ව යොමු වූ අප
වසර දෙතිස නික්මී අද හමු වූයෙමු මේ ලෙස යළි
"මහමායා අභිවන්දන" විලසින් ගුරු පා පුදන්න

රොබරෝසි පලස මත - අරලියා වදුලු යට
නිම නොවූ පිය තෙපුල් - අද ද දෙඩමළු වෙලා
දුලබ ගුණ හද රැඳුණු - සොඳුරු මිතුරියො රැන
අතර පෙරමුණ යසස්ශ්‍රී නොවී නම් අපට
නැත අපට මිතුරු හමු - මේ තරම් පිළිවෙලට
දයානිත් - සුනේත්‍රා - නිමාලිත් - මල්ජිනීද
මංජු - මල්කිත් - ප්‍රියංවද - ප්‍රීති සිට එරට
තව නොකී නමින් යුතු - "මැණික් මායාවියන්"
ශ්‍රමයෙන් ද ධනයෙන් ද වෙහෙස වී කැපවෙමින්
උදු කළ අද දිනෙත් - අප දිවිය සුවඳ විය!!!

මතක සැමරුම - දිල්රුකා ඇරැගොඩ මිය

## 24. උවසර ගීතය

රුවින් ගුණෙන් සොඳුරු මවකි මායාවේ දිලුන
සයුරින් සිප් - එතෙර කෙරූ යාත්‍රාව වැන්න
ඉතින් නොහැකි දිගු ම අමිල සේවයක් මනින්න
පවන් රළක් ලෙසින් හමා ජීවය වී ඉන්න

දසත් විදා පසන් සිනා පානා මායා වියෝ
හසුන් විලස දියෙන් කිරි ම වෙන්කර වැජඹුනෝ
නඳුන් උයන් විමනක අප ඔබ හා හමුවුනෝ
සඳුන් අරටු ලෙසින් සුවඳ විහිඳ සැනසුනෝ

රටට දූයට හිතැති දූහැමි සේවය යළි දෙන්න
කළල් දියෙන් නැගි පියුමක් සේ යළි පිබිදෙන්න
දිවි දුක් සැප සමසේ විඳ නිරතුරු සැනසෙන්න
දළඳා සමිඳුන් සරණයි අවසර සමුගන්න

පද සංකල්පනය :

ස. විදු. දිල්රුකා ඇරැගොඩ
මහාමායා බාලිකා විදුහල
මහනුවර

(2025. 01. 08 මහනුවර මහාමායා බාලිකා විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිනි හිමාලි සේනාධීර මහත්මියගේ ස්ථාන මාරුව ලැබූ දා එතුමිය වෙනුවෙන් නිර්මාණය කළ උවසර ගීතය)

## 25. බුද්ධං සරණං ගච්ඡාමි

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

සමිඳුනි සුවහස් අසරණයින්හට
ඔබ දුන් සහසක් ඔවා මිණි
එදාට වැඩියෙන් අදයි වටින්නේ
සුගත තථාගත අනාථ නාථයිනි....

බුද්ධං සරණං ගච්ඡාමි....

යුධ - ජල - ගිනි බිය අභියස සැලෙමින්
අනාථ මනුදම් දැවී නිවී ගොසිනි
ඔබ දම පමණක් කෙලෙසද නොසැලී
අකම්පිත ව අද අනාථ නාථයිනි

බුද්ධං සරණං ගච්ඡාමි

කර්කශ ලොව තුළ රසාලිප්ත ස්වර
ඇසුවේ සුලලිත අමා දහම් ගීතෙන්
රුදුරු දසුන් මැද සොඳුරු ම සිතුවම
මැවේ නිවුණු බුදුරුව දක්නා පමණින්

හිමි නැති ගමනක මුලාව දක දක
අනාථ වූ අප නිවාලන්න සමිඳේ
සනාතන දහම ඔරුවක් කරදී
මේ සසරින් අප මුදාලන්න සමිඳේ...

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ
(නියෝජ්‍ය විදුහල්පතිනි - සීතාදේවී බාලිකා විදුහල)

තනුව - දයා බණ්ඩාර ඉලංගකෝන් මහතා
(සංගීතාචාර්ය - සීතාදේවී බාලිකා විදුහල)

* ස්වර්ණවාහිනී රූපවාහිනී නාලිකාවෙන් පවත්වන ලද 2007 සමස්ත ලංකා අන්තර් පාඨශාලීය වෙසක් බැති ගී තරඟාවලියෙන් මහ/සීතාදේවී බාලිකා සිසු දියණියන් 2වන ස්ථානය ලැබූ ගීතය
*ප්‍රවීණ ගීත රචක අජන්තා රණසිංහයින් විසින් මෙය හොඳ ම පද රචනය ලෙස ද නම් කරන ලදි

## 26.සීතාදේවී විද්‍යාලයීය කුළුඳුල් කලා උළෙල - පිළිගැනීමේ ගීතය 2007

කොඳමල් හිනැහෙයි - සුනිමල සඳපහනේ
පිනිමුතු දිදුලයි - විකසිත රිවි කැලුමේ
සඳුන් සිසිල දෙයි - සුසුමුදු මඳ පවනේ
මුදු සිත් නැළවෙයි - සුළලිත සත්සරිනේ
ඔබේ පබා දෑහැනේ.....

ඔබ ගැයූ ගී හද පත්ලේ කිමිදී - නෙතඟින් මුතු කඳුලකි මැවුනේ
මියුරස වෙණ තත්සර හඬවන සඳ අප හද අනුරාවය නැගුනේ
යුග යුග වන්දිත සොඳුරු ඇදුරු ඔබ රස විකසිත හද මල් අරණේ
ඔබේ අරුම සුසුවඳ සුරකෙන්නයි - සරසවි බැල්මෙන් රන් දෙරණේ

විදුහුරු රුදු අවි දූය වනසන සඳ මෙත් ගී ගඟුල ඔබයි
ඉසිකෝ මන්මද ගිනි නිව් අමසර සෙත් පිරිතකට සමයි
නිසරු දුගති සිත් පුල් පියුමන් කළ නිර්මල සුවඳ සඳයි
හිස අත හදවත සරුකොට ඔබ දෙස බස රුස පණ ගන්වයි

මවා ගිරග වන්දන හිම සිසිලස සිතුවිලි පාරාදීසයේ
නිවා තාප සෝ ළතැවුල් සරතැස් පුහුදුන් සිත් සන්තානයේ
රාව නැගේ අම මියුරු සකුණු මියැසිය සේ අරුණු ප්‍රභාතයේ
චමත්කාරයෙන් සුපසන් දිව්ගංතෙර ගිම් නිවනා සුයාමයේ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ
(නියෝජ්‍ය විදුහල්පතිනි - සීතාදේවී බාලිකා විදුහල)
තනුව - සංගීතාචාර්ය වජිර තුමුලවීර මහතා

(මහනුවර සරසවි කලායතනය මගින් එහි නිර්මාතෘ කලාවේදී එම්. ජී. සුගතපාල මහතාණන්ට උවසර පිදීම සඳහා ද මෙය එතුමාගේ 92 වන ජන්ම දිනයට එතුමාගේ දෙයු පුත් වජිර තුමුලවීර මයා විසින් යොදගන්නා ලදි)

## 27. ගුරු වන්දනා තුති කුසුම් ප්‍රණාම

'අ' යනු කියා ඔබ තුරුළට ආ දිනයේ
මට පෑ සෙනේ හෙට ජය ගැනුමට දිරිදේ
පිරිපුන් ගුණ නැණින් දිවි මග එකලු කළේ
සක්විති වුණත් අප ඔබහට ණයගැති වේ

පුන්සිසි සදිසි සොමි ගුණ හදවත රැන්දූ
සුන්දර මදහසින් අප නෙත් මන බැන්දූ
කුළුණු ගුණෙන් සිසිලස අප වෙත කැන්දූ
ඔබමය අපේ දිවි ඔප කළ සුර ලන්දූ

පිය සෙනෙහසින් අප රැකි ගුරු පියාණෙනි
සාර සිප් සැදූ අප වෙත දයාවෙනි
මව්පිය දරුසේම අප බැඳි නිසාවෙනි
සසරේ යළිදු හමුවේවා කළ පිනෙනි..../ /

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ

(2012දී ගුරු දිනය නිමිත්තෙන්
මා සේවය කළ සීතාදේවී බාලිකා විදුහලේ ආරම්භයේ සිට 1980-2012 දක්වා සේවය කළ
සියලු විදුහල්පතිනියන්, නියෝජ්‍ය/සහකාර විදුහල්පතිනියන් හා ගුරු භවතුන්ගේ සේවය ඇගයීම උදෙසා පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ ඇරයුමෙන් රචිත ගුරු උපහාර ගීතය)

## 28. සීතාදේවී බාලිකා විදුහලේ 2013 දී
## මුද්‍රිත වෙසක්පත් සඳහා මවිසින් රචිත කවි

සම්බුදු මහිමෙන් - ලෝ නැහැවේවා!

සරා සැකි කප් කලක් දස පාරමී පුරා
දරා නෙක දුක් ගැහැට මෝහ තිමිරය ඉරා
නුරාගික පුහු මනස විරාගෙන් තෙත් කරා
නිරාමිස සුව සැදි සසර සරනා තුරා

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ
චිත්‍ර - ධම්මිකා ගුණරත්න
(චිත්‍ර ගුරුතුමිය)

බුදු මහිමෙන් - ලෝ නැහැවේවා!

මනහරයි සිරිබරයි - සුපිපි වනමල් වදුල
සුන්දරයි පින්බරයි - මේ උදුල සඳ මඬල
නිර්මලයි පිවිතුරුයි - අමා දම් මුදු සිසිල
පහන් වී සොම්නසින් - නිවේවා සෝ තැවුල

නිර්මාණය - දිල්රුකා ඇරැගොඩ
චිත්‍ර - ගයනී කුමාරි රණතුංග
(චිත්‍ර ගුරුතුමිය)

## 29. English camp welcome song

**We welcome all of you**
**With blissful hearts so true**

**Here we are at English camp**
**Let's speak English sing and dance**
**Enjoying time full of laugh**
**We'll shine like twinkling stars**

**We welcome all of you**
**With blissful hearts so true…….**

**Lyrics –Mrs. Dilruka Eragoda**

**(2019දී සීතාදේවි විදුහලේ ඉංග්‍රීසි අංශයේ රිද්මි දහනායක ගුරු සොයුරියගේ ඇරයුමෙන් රචිත ය)**

## 30. Welcome song – Connecting classroom

**With smiles and greetings true**
**We welcome all of you //**

**Here we're one family**
**We welcome you with full of glee //**
**Sharing and caring go hand in hand forever**
**We welcome you all with love and sincere**

**We're just like blooming buds**
**Hoping to flourish and nourish with help**

**With smiles and greetings true**
**We welcome all of you //**

**Lyrics –Mrs. Dilruka Eragoda**
**Music – Mr. Stanly Kirindage**
**(Master in charge of Music Seethadevi Girls' College)**

**(විදුහලේ Connecting classroom ව්‍යාපෘතිය සඳහා බ්‍රිතාන්‍ය කවුන්සලයේ බ්‍රිතාන්‍ය අමුත්තන් පිළිගැනීම සඳහා ඉංග්‍රිසි අංශ ප්‍රධානි ලලනා ඒකනායක හා ශ්‍යාමලි රඹුක්වැල්ල ගුරු සොයුරියන්ගේ ඇරයුමෙන් රචිතයි)**

### 31. සැබෑ සංහිදියාව

දළදා පුරවර නිල් කඳු පියසින්
උතුරැකරේ තල්රුප්පාවේ රැඳි
සෙනෙහසේ තක්සලාව දැකුමට
ගියෙමි සිහල දැරියන් හා රොදබැඳ
මග දුර බෝ වුව - අව් රැස් දැඩි වුව ;
සා පවස ද ගිමන ද නිමවාලා
නළලත කුංකුම තිලක තියාලා
අප පිළිගත් නුඹෙ ලාලන ලීලා
සොබමන් රැගුමන් නෙතු පිනවාලා
මෙතුවක් කොයි සිටියේදැයි නොමදත්
දූරියන් විදුබිම කිරුළු හිස දරන්
ගැයුම් වැයුම් සිතුවමින් කෙළිදෙලෙන්
සොම්නස් හැඟුමින් එකමුතු වී
රස බොජුනින් හිම කිරමින් සැනසී
සැමරුම් තිළිණ පුදා මදහසිනි
මෙත් හැඟුමින් සැම පුදබිම් පුද දී
යළි හමුවන පැතුමින් මුව සැරසී
දුටිමි නෙතග රැඳි තුටු කඳුලැල්
හෙට නුඹ ලොව වෙනු ඇත මනකල්
සුනිල විලක නුඹ සැම මුදු පියුමන්
විදි සංහිදියා සුව සිහිලැල්

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

(සාමය, සංහිදියාව වෙනුවෙන් 'සෙනෙහසේ තක්සලාව' වැඩසටහනට අනුව සීතාදේවී සිසු දූරියන් හා ගුරුභවතුන් යාපනයේ ශාන්ත අන්තෝනි බාලිකා විදුහලට යාමේ සුහද චාරිකාවෙන් පසුව ලියැවුනකි)

# 32. ආශිංසන

පැහැසර රන් අරුණැල්ලක් විලසින

අප දරුවන් පිරිපුන් ගුණ නැණයෙන

මතු දිවි ඒකාලෝකාව සරසන

ඔබතුමි අපමණ ගැහැට දරාගෙන

විදුබිම - කැප කළ අනුපම මෙහෙයට

පුදනෙමු තුති මල් සදානුස්මරණ

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

(කෙටි කලක් වුවද සීතාදේවියේ හැරවුම් ලක්ෂයක් සේ අනගි සේවයක් කොට 2011දී විදුහලෙන් සමුගෙන ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයට උසස් තනතුරක් ලබා සීතාදේවියෙන් සමුගත් විදුහල්පතිනි ලක්ෂ්මි මලලගම මහත්මිය වෙනුවෙන් පාසලින් පිරිනැමුණු සිහිවටනයකි)

## 33. පූජාච පූජානීයානං..........

මුල'කුරු කළ සිරි දළදා පින් බිමෙනි
දයේ පිනෙන් ජනිත වූ මහැදුරුතුමනි
නිවාලමින් සරතැස බස පුබුදමිනි
දසුනින් ඔබේ - අප පින් කළ බව දනුනි

පොදු ජන දිවිය හා අත්‍යන්තයෙන් බැඳි
ජන වහරින් හෙළිවන ජීවන දසුන ද
හමන ජීවන සුවද ද මේ යැයි
අද්‍යතන දයට හඳුන්වා දීමෙන්
මහ සිංහලයේත්, එහි උපභාෂාවන්ගේත්
ඖදාර්යය මේ යැයි
මනසින් ගිලන් වන සමාජයකට පිරිනමමින්
අද්විතීය, උත්කෘෂ්ට, අනුපමේය මෙහෙවරක්
පින්සර ජන්මභූමියට ඉටුකළ
මහාචාර්ය ජේ. බී. දිසානායක මැතිතුමන්හට
භක්ති පූර්වක ගෞරව ප්‍රණාමය පිරිනමමු

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ

(විදුහල්පතිතුමිය, ඇඳුරුමඩුල්ල, ඇතුලු සිසු දියණියන් වෙනුවෙන් නී. විදුහල්පති කේ. කුමාරගම මියගේ ඇරයුමින් මහ/ සීතාදේවි බාලිකා විද්‍යාලයීය වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේදී 2012 වසරේදී ප්‍රධාන අමුත්තානන් ලෙස පැමිණි මහාචාර්යය ජේ. බී. දිසානායක මැතිතුමන් වෙනුවෙන් ලියැවුණු පූර්විකාව)

## 34. රණවිරු උපහාර

අපේ හසරැලි - අයිති ඔබටයි

ඔබේ කඳුළැල් - අයිති අපටයි

ඔබේ රුහිරෙන් - ජනිත දරු කැළ

අපේමයි - නැත - කිසිදු වෙනසක්

නහවමින් සෙනෙහස් ගඟුල තුළ

පොවා සිප්කිරි - වඩා ගුණ නැණ

පුදමු හෙට දින - දූයේ නාමෙන්

- සීතාදේවි ගුරු කැළ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ

(තිස් වසරක යුද ගිනි ඇවිලෙන සමයේ සීතාදේවි දියණියන්ගේ රණවිරු පියවරුන් හා සොයුරු කැළ වෙත යැවූ සිහිවටනයයි)

## 35. ප්‍රීතිමත් ළමා දිනයක් !

හිච්චි කමට පුංචි වැරදි

කළත් අතීතයේ

නැණ ගුණ සරු දිවි දරුවෙකු

වෙනු මැනවි දුවේ...

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

(2014 ළමා දින සැමරුම වෙනුවෙන් තිළිණයක් ලෙස මුද්‍රිත 2015 සාක්කු දින දර්ශනයක් සඳහා ලලනා ඒකනායක ගුරු සොහොයුරියගේ ඇරයුමෙන් රචිතය.)

## 36. නව නිර්මාණාත්මක වන්නම - මව්පිය සෙනෙහස

තිත - මැදුම් මහා තනි තිත
මහා තනි ති
තානම - තනෙන තන තන /// තනෙන තනා
තිනෙන තින තින /// තිනෙන තිනා

තොටිල්ලේදීම ලලිත රස දී
ගයා නැලවිලි මුදුසුමුදු ගී
සොඳුරු ලොවකට දොරටු ඇරදී
නෙතේ ගැටුනු මුල් රුවයි මැණී

කවිය - නිසල හද පොබකළ නිකැළැල්
උදුල සඳ මෙන් වේය සුවිපුල්
තුමුල මහමෙර විලස අචල වූ
මපිය සෙනෙහස ගඟුල සේ සිසිල්

නමස්කාරෙන් රඟ බැතියෙන
වඳිමු නිවහන සරණ දෙවිඳුන්
එදෙගුරුන් සේ නොමැත පිහිටක්
දස අතට දිව ගියත් අසරණයන්

උතුම් බෝසත් ලබා විවරණ
තිලෝගුරු පාරමී පූජිත
වීය දියතෙහි දසත පූජිත
අමිල මව්ගුණ වීය විකසිත

විසල් තුරුවට - වෙලි ලපලුලෙද
ළපටි මුකුළුව - මා පියන් මැද
ලෝ එකලු කළ - දසුන මනකල්
පාන වන්නම මපිය සෙනේ නිමල්

දැවෙන හදටම දෙමින සැනසුම්
සැණෙන තුන්සිත කරන උණුසුම්
මැවෙන රසපල නිතින මනරම්
පිපෙන කප්රුක සෙනේහේ කුසුම්

දියත සරසන සොඳුරු රුසිරු
මවයි මව්කිරි රසින් මියුරු
සැවොම පිනවන කිරණ ළහිරු
සේ මපිය පෙම ගුණෙන් මහරු

තානම - තනෙන තන තන /// තනෙන තනා
තිනෙන තින තින /// තිනෙන තිනා

**නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ**

**කලාප නර්තන තරඟාවලියේ නව නිර්මාණ සඳහා නර්තන ආචාරිනී ලලිතා සෙනෙවිරත්න මහත්මියගේ ඇරයුමෙන් රචිතයි.**

**2007 ප්‍රවීණ කලා13 ජයලත් මනෝරත්නයන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ 11 සීතාදේවියේ කුළුඳුල් කලා උළෙලේදී රඟදක්වන ලදී.**

## 37.Annual English Day – Welcome Song (2012)

**With smiles and greetings true**
**We welcome all of you //**

**Here we're one family**
**We welcome you with full of glee //**
**Sharing and caring go hand in hand forever**
**We welcome you all with love and sincere**

**We're just like blooming buds**
**Hoping to flourish and nourish with help**

**With smiles and greetings true**
**We welcome all of you //**

**Lyrics –Mrs. Dilruka Eragoda**

**Music – Mr. Stanly Kirindage**

**(Master in charge of Music**
**Seethadevi Girls' College)**

## 38.English Day – Welcome Song (2018)

## SEETHADEVI GIRLS' COLLEGE

**Sea is like life – changes always**

**Waves move on – as our thoughts**

**Minds are waking – waves are rising**

**But turn calm at Sandy shore**

**Welcome you all warmly**

**To our English Day**

**To sail beyond the horizon**

**To reach goals same as pearls**

**It's our sincere wish**

**We cherish your blessings**

**Welcome you all warmly**

**To our English Day**

**Deep silence rough storms – alluring seashells**

**Awesome beauty – touching hearts**

**Oceanic lessons – show us the passion**

**Oh! What a fascination!**

**Welcome you all warmly………..**

**Lyrics – Mrs. Dilruka Eragoda**
**(Deputy Principal)**
**Training and music – Mrs. Shiroma Manthrirathne**
**(Sectional Head of English Unit)**

## 39. ධරණීය සංවර්ධනය කරා.....

සිතන්නට සිතක් අනුභව කරන්නට මුවක්

ඇති වග පෙනුනාට

අසමබර බවක් රජයන විලාසය පෙනේ

මිලිනව සිත සතුට

නිලඹරක් හරිත පලසක් මිහි මඩලත්

දුන් සම්පත් එක මිටට

පිරිමසමින් තිරසාර ව සිටිමු එල

ලබමු රැකගමු හෙට දිනට

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

**(Think – Eat – Save නම් වූ ව්‍යාපෘතියක් සඳහා සීතාදේවී විදුහලේ වෙනත් ගුරුතුමියක් සඳහා ලියා පරිත්‍යාග කරන ලදි)**

## 40. 2007.08.02 දින මල්වතු විහාරස්ථානයේ පැවති වැලිවිට සරණංකර අනුස්මරණ උත්සවය සඳහා රචිත අනුස්මරණ ගීතය

දළඳා සෙවනේ වැව්තෙර සිසිලේ
මහ සඟ රජ මාහිමි ගුණ කඳ රැව්දේ
අනුපමේය වූ යශෝරාවයෙන්
සෙංකඩගලපුර ඇළලේ....

නිකසල දහමේ නිර්මල අනුහස පතුරා
දුශීල සමයේ අඳුමිටු දම්සක් පරදා
ශීල ගුණෝපිත සත්‍යවාදී බව වපුරා
උදුල සඳකි පැයූ බුදු සසුන සිසාරා

සහස් උපසපන් සඟ පරපුර දූය ගණඳුර දුරලන රන් පහනයි
පිරිවෙන් දම්පොත් බිහි වී සම්බුදු චිරස්ථිතිය අද සැදුනයි
සඟ සසුනේ නිසි පිළිවෙත් සැදූමෙන් සදා අනුස්මරණීයයි
සරණංකර සමිඳුන් සතු මහිමය අංජලිකරණීයයි

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ
(නියෝජ්‍ය විදුහල්පතිනි - සීතාදේවී බාලිකා විදුහල)
තනුව - සංගීතාචාර්ය දයා බණ්ඩාර ඉලංගකෝන් මහතා
ගායනය - සීතාදේවී බාලිකා සිසු දියණියන්
(සීතාදේවී විදුහලේ ඒ.පී.ඩී. සුමනසිංහ විදුහල්පතිනියගේ ඇරයුමින් රචිතයි)

## 41.වැව්තෙර ගිරිහිස - සැරදේ දම්රද

අදිරද බැමි බිඳ - පෙන්වූ ඔදතෙද

වැව්තෙර ගිරිහිස සැරදේ දම්රද

දල්වන නිතියෙන් - බැතිපෙම් අප හද

ඔබමය ඔවදන අප දිවි සැඳුමට

ඔබමය අභිමන අප හෙට දිනයට

ගල්මුල් බාධක මැඩගෙන දිවිමග

ජයට දිරිය ඔබ පෙන්වන නිසි මග

සුරු විරු දරුවන් බිහි ව මෙබිම මත

මහරු මිණි ව ලොව දස අත බැබලින

රුසිරු දසුන් නෙත - පිනන ඉමකි මෙය

සොඳුරු සිතුම් නිති වපුළ බිමකි මෙය

අසෙනි කුසුම් වී හෙට ඔබ පෙර මග

නමදිමු බැතියෙන් ඔබ පාමුල හිඳ

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

(2012දී දම්රදයේ 125වන සංවත්සර සැමරුම සඳහා මපුතු චමල් තිලකරත්නගේ ඇරයුමෙන් රචිතය)

## 42.ලොව්තුරු සුව සොයා....

සඳ සිලිලාරයේ නැහැවී සිහිලැල්ලේ
බෝපත් මුදු සරින් සසැලේ පවනැල්ලේ
ඒ හා මසිත යාවී සුව සිතිවිල්ලේ
සුපහන් මෙත් සිතින් රැඳුනෙමි සුදුවැල්ලේ

සම්බුදු රදුන් සතියක් මෙත් දහර විදා
අනිමිස ලෝචනය පුද කළ ගුණය ලෙදා
නිරාමිස සුවය සැදූහැකි සිතෙහි රඳා
සමාධියයි සැදුනේ බෝ සෙවනෙ සදා

කුලුණු දයාවකි සැම නෙතු දැලවරේ...
බෝපත් අතර සඳ දියවර නිබඳේ පෙරේ...
චමත්කාරයෙන් තුන්සිත පහන් කෙරේ...
ඉසිකෝ මතින් තොර ලොවකට දෙරටු ඇරේ...

සැලෙනා පහන් සිළුවෙන් එළිය කෙරේයා
දැවෙනා සඳුන් සිහිලෙන් සිත නිවේවා
විකසිත කුසුම් සුවඳින් සිත පිරේයා
විසිරුණු සිත් සතන් එක් කෙරේයා

සුසුදු වතින් සැරසුණු උවැසියන්නේ
නිසල වතින් දැහැනට සම වදින්නේ
පිවිතුරු සිතිනි මේ පියවර නගන්නේ
සංහිඳියාව ලොව්තුරු සුව ගෙනෙන්නේ

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ

(තලාතුඔය පල්ලේගම ශ්‍රී සාරිපුත්‍ර දහම් පාසලේ ප්‍රධානාචාර්ය හපුතලේ විමලධම්ම හිමිගේ ඇරයුමින් සූර්ය ප්‍රභා වාර්ෂික පුවත්පත වෙනුවෙන් මවිසින් රචිතයි)

## 43.අභිනවයෙන් පත්වන ලද උඩරට අමරපුර මහා නිකායේ මහනායක හිමියන්ගේ පිළිගැනීමේ උළෙල සඳහා වූ

## පිළිගැනීමේ ගීතය - 2017

මෙත් මුදිතා කුලුණින් ලෝ නැහැවූ - සම්බුද්ධානුභසින්
සැනසෙන පින් බිම සපැමිණි සැමටයි - මේ අසෙනිය කුසුමන්
වන්දනීය අභිනව ගරුතර මහනායක හිමිපාණන්
සපිරිවැරූ උත්තම සඟරුවන ම පුදමු නමස්කාරෙන්

ස්වස්ති ශ්‍රී සුභ මස්තු....

පින්සර දෑ කුල දෙව් පරපුර රන්දෙරණේ
දූල් වූ සදහම් ප්‍රඥ මිණිකැන් පහනේ
එළියෙන් පෙරමග දිදුලයි රට දූය සසුනේ
සව් සිත් පියුම් පිපේවා බුදු පුත් සෙවනේ...
සපැමිණි පින්බර ඔබ සැම පිළිගමු බැතිනේ...

ස්වස්ති ශ්‍රී සුභ මස්තු....

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ

තනුව හා සංගීතය - වජිර තුමුලවීර මහතා

(සංගීතාචාර්ය - සීතාදේවී බාලිකා විදුහල)

(සුබෝධාරාමයේ පූජ්‍ය අස්සජි හිමියන්ගේ ඉල්ලීම පරිදි දායක සභාවේ අනුමැතියෙන් මවිසින් රචිතයි)

## 44. ඵලදායිතා

හරි දෙය ම නිසි කලට
නිවැරදි ව කිරීමෙන්
එක් දෙයට - එකක් නොව
වැඩි පමණ ලැබීමෙන්
දිගු කලක් පැවතුමට
අප වෙනස් විය යුතුය
පිහාටු සලමින් පවන් රැලේ
හොට තලමින් කළුගල් පව්වේ
යළි යළිදු අලුත් වන
රාජාලියෙකු සේ නිල් ගුවනේ
දුර ද දසත ද බලන
තියුණු දක්මෙන් යුතු ව
සරු පොතින් - ගුණ නැණින්
පිදෙන සුව පිය වදන්
බුදින සේ ගුණ බොජුන්
අදින නිසි සළු පිලෙන්
විදින ගී අමසරින්
විනෝදයි රස මවයි
ඵලබරයි දිවිගමන්......

නිර්මාණය - දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ

(මහ/ ස්වර්ණමාලි බාලිකා විදුහලේ අන්තර් විද්‍යාලයීය ඵලදායිතා තරගාවලියේ ගුරු නිර්මාණ (නිසඳැස්) 2වන ස්ථානය ලැබූ නිර්මාණය)

## 45.1 වසර සිසුන් පිළිගැනීමේ ගීතය - 2026

එන්න නංගියේ එන්න මල්ලියේ
පාට පාට මල් පිපිලා අපේ පාසලේ
සමනලයෝ වාගේ පියා සලාලා
කුරුලු පැටව් වගෙ ලස්සන ගීත ගයාලා

සුළං වගේ දුවමු සෙල්ලම් මිදුලේ
පුළුන් වගේ නටමු දෑත විදාලා
බෝල වගේ අකුරු ලියමු අපි හැඩ කරලා
එකයි දෙකයි තුනයි කියල ගණන් හදාලා

ඉස්කෝලෙත් ගෙදර වගේ හොඳ තැනක් තමයි
පුංචි යාළුවොත් අයියල අක්කලත් හොඳයි
උදේ ම එන ඔයාලාට අපිත් ආදරෙයි
ගුරුතුමී අපේ - ආදර අම්ම වගේමයි

එන්න නංගියේ එන්න මල්ලියේ

පද සංකල්පනය :

ස. විදු. දිල්රුකා ඇරෑගොඩ
මහාමායා බාලිකා විදුහල
මහනුවර

(මහාමායා බාලිකා විදුහලේ සංගීතාචාරිනී මධූ අධිකාරි මහත්මියගේ ඉල්ලීමකට අනුව වෙනත් පාසලක් සඳහා තිළිණ කරන ලද්දකි)

## 46. එක ම දියණියය වෙනුවෙන් ලියූ ගීතය

ස්වේත වළාවෙන් මුතුපිනි සිහිල අරන්
බිඟු රොද බැඳි තුරුමත මල් සුවඳ උරන්
ඉඳු දුනු සඳු තරු කඳු - මුතු සයුරු කෙරෙන්
ලෝ වෙත ආවා රන්මිණි දියණිවරුන්

සුමුදු දෙපා පිස මිහිමව් හිනැහේවි
සෙමෙර සලා නිල් තුරුපත් නැළවේවි
පිවිතුරු මඳහස මියුරු හැඟුම් දේවි....
චමත්කාරයෙන් ජීවය පුබුදාවි....

සා මුව පොව් නුඹ හද තුළ දඟ පානා
ගෝර සපුන් ගැන කිසිත් නොදත් ගානා
මිතුරු වෙසින් පෙම් සළෙලුන් රඟපානා
අවිහිංසක නුඹ ගොදුරක් සේ පේනා

රුදුරු ලොවක තතු නොම දන මුවැත්තියේ
සමනල් ලෝකෙක සරනා බටිත්තියේ
ඉසිකෝ මන් නාඳුනනා සිතැත්තියේ
දුර දක රැකගත් රන්මිණි ජීවිතයේ

පද රචනය - දිල්රුකා ඇරැගොඩ

## 47.මගේ මවගේ 80වැනි ජන්ම දිනය වෙනුවෙන් ලියූ ගීතය

සිත පිරිපුන් - අත් පොතක් වගේ
වත සිසිකැන් - මුදු සිලිල රැදේ
නෙත පැහැදුල් - සෙනෙහසයි හදේ
අරුත විසල් - දිවි පහනෙ ඇගේ

තුඟු ගිරි හිස පවනැල්ලේ සුව සිසිලස විඳිමින්
පැහැසර අරුණක විකසිත කුසුමකි මගේ මවුන්
සුපසන් මනසින් දරු කැලකටදී සරු දැකුමන්
එඩිතර නිරවුල් ගුරු තරු මිණ මය අඹිමන්

සීත සඳුන් අරටු විලස - සිඳිත මඬිත සුවඳ විඳිත
පිළිවෙත් සරු පරපුරකට - ඔසු පැන් කළසක් විය
ඔබෙ ගුණ අම්මේ.......

නැණ මිණි මුතු සහසක් ලෝ වෙත පිදුවා
ඒ මුතු පෙළහර සිරිසර ඔබ දුටුවා
දිවි සලරුව රන් දියවර සේ ගැලුවා
නිසංසලේ සැන්දෑ ඉසිඹුව ලැබුවා ! //

පද රචනය - දිල්රුකා ඇරැගොඩ

ගායනය - කලණ ඇරැගොඩ

සත්සර සංයෝජනය - සංගීතවේදී ජීවන් රොක්සාමි මහතා සහ
සංගීතවේදී ඇන්තනී සුරේන්ද්‍ර මහතා

නාද සංකලනය - ඩී. බටංගල මහතා

## 48.ළමා අයිතිවාසිකම් රැකීම සමාජයේ ප්‍රගමනය වැදගත් වන අයුරු

ළමයා යනු සුවිසල් වූද පුළුල් වූද සංකීර්ණ වූ සමාජයක් තනනු ලබන වැදගත්ම අංකුර ඒකකයයි එබැවින් හෙට සමාජයක පැවැත්මෙහි ස්වභාවය අද ජීවත්වන ළමයාගේ පෞරුෂය යන සාධකයෙන් තීරණය වන බව වටහා ගැනීම අපහසු නැත.

යහපත් පුරවැසියෙකු ලෙස සමාජගත වීමට නම් නිවැරදිව ගත කළ සොඳුරු ළමා වියක් හිමි වී තිබීම අතිශයින් වැදගත් වේ.දරුවෙකුට තම ශාරීරික ,මානසික ,සදාචාරත්මක හා චිත්තවේගී සංවර්ධනයන් නිසි කළ නිසි පරිදි ඉටු වී ඇත්නම් ඔහු සමබර පෞරුෂයක් සහිතව වැඩුණු අයෙකු වීම වැලැක්වීය නොහැකියි.ඔහු සමාජයට පිළිලයක් නොවී ,තම ශක්‍යතා හඳුනාගෙන තම යුතුකම් ඉටුකොට සමාජයට සේවයක් කරන පුද්ගලයෙකු නම් - ඔහු වැන්නන් බහුල වූ තරමට සමාජ ප්‍රගමනය සිදුවීම වැලකිය නොහැක.

සාර්ථක පුද්ගලයෙකු වීමට මුල් අඩිතාලම දමන එම ළමාවිය නියමාකාරයෙන් ගත කිරීමට නම් එම දරුවාට හිමි විය යුතු වරප්‍රසාදයන් රැසකි.මේවා "ළමා අයිතිවාසිකම් (child rights) ලෙස හඳුන්වනු ලබයි.පළමුව එම වරප්‍රසාද දීමට හේතුන් සලකා බැලීම උචිත බව හඟිමි.

ප්‍රකට අධ්‍යාපන විද්‍යාඥයෙකු වූ ජීන් ජැක් රූසෝ පවසා ඇති පරිදි "ළමයා කුඩා වැඩිහිටියෙකි". එමෙන් ම ෂෙඩ්රිඩ් බෙල්ට් නම් විද්වතාගේ මතය ද සුවිශේෂය.

"ළමා විය යනු වැඩිහිටි දිවියට සූදනම් වීම පමණක් නොවන බවත් එම අවධියට විශේෂිත වූ අයිතීන් හා නිර්මාණාත්මක ශක්තියෙන් වූ අව්ධියක් වන බවත් ඒ නිසා ළමා අභ්‍යන්තරය විකසිත වීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බවත්" ඔහුගේ වටිනා අදහසයි.
මනසින් බැලූ කල ළමාවිය මිනිස් දිවියේ වැදගත්ම අතිශය තීරණාත්මක අවධියක් වන බව නොකිවමනාය.

තෘප්තිමත් ළමා වියක් තුළින් සංවර්ධිත පෞරුෂයක් කරා යන මනුෂ්‍යයෙකු බිහි කළ හැකි බව අවිවාදිතය.මේ බව පිළිගන්නා ලද්දේ අද්‍යතන යුගය තුළම නොවේ.
මීට වසර දෙදහස් පන්සීයයකට වඩා දුර අතීතයේ ආසියාවේ පහළ වූ ශ්‍රේෂ්ඨතම දර්ශනිකයෙකු වූ බුදුරදුන් ද අසරණ වූ සුනීත ,සෝපාක බඳු කුලහීන දරුවන්ට පිහිට වී නැවත සමාජගත කොට නිසි ගෞරවය ලැබීමේ අයිතිය ලබා දුන් සේක.
පසුකාලීන ව ලොව ,පුනරුද යුගයේ වූ කාර්මික විප්ලවයෙන් පසු සමාජීය අණපනත් ලෙස අනිවාර්ය අධ්‍යාපනය ,ළමා මෙහෙකාර සේවය පිළිබඳ සැලකීමට ප්‍රමුඛත්වයක් ලැබුණි.
පසුව ලොව පුරා ව්‍යාප්ත වූ ළමා පරපුරට සෙත සදනු වස් ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත වීම මානව වර්ගයාගේ සැබෑ ජයග්‍රහණයකි.
හෙට මිනිසා අද ළමයාගෙන් නිර්මාණය වන නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය ළමා අයිතිවාසිකම් පිළිබඳව මනා කැපවීමකින් එදා සිට දක්වා ඇප කැප වේ.
1979 වසර ජාත්‍යන්තර ළමා වසර ලෙස නම් කොට ළමා යහපත සඳහා පුද්ගලික ආකල්ප වර්ධනය කිරිමෙන් සමාජ, මනෝවිද්‍යාත්මක, ආර්ථික හා අධ්‍යාපනික වශයෙන් ළමා සංවර්ධනය කිරීමට එම ශ්‍රේෂ්ඨ සංවිධානය ක්‍රියාත්මක වේ.

ළමාවියේ වැදගත්කම හා වඩා ආරක්ෂාකාරී ජීවිතයක් සැලසීම පරමාර්ථ කොටගත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය තුළින් ,සෑම ළමයෙකුට ජීවත් වීමේ ,සංවර්ධනය වීමේ ,සහභාගී වීමේ ,අයිතීන් භුක්ති විඳීමේඋත්තුංග අපේක්ෂාවන් ඉටුවීම අපේක්ෂා කෙරේ.
රජයෙන් මූලිකව මේ අයිතිවාසිකම් ඉටුවීම ද අපේක්ෂිතය.ජීවත්වීම සඳහා සෑම ළමයෙකුටම ඇතිවන නෛසර්ගික අයිතිය ,ළමයා වැඩීමට රැක බලා ගැනීමට පෝෂණය කිරීමට ඉගෙනුම ලැබීමට දෙමාපියන් මෙන්ම රජය ද වගකිව යුතු වීම ,උපතෙහි සිටම සෞඛ්‍ය සංරක්ෂණය ,පවුලේ ආරක්ෂාව අහිමි වූ දරුවන්ගේ සුබසිද්ධිය සැලසීම ආදිය මේ අතර වැදගත් වේ.මෙම අවශ්‍යතා දරුවාට තම පවුලෙන් හෝ රජයෙන් ඉටුවන විට දිවියේ හෙට දවස පැහැපත් වීම වැලකිය නොහැක.නමුත් ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් දස දෙසින් ඇසෙන විට හෙට සමාජයේ ප්‍රගමනය පිළිබඳව සැක මතු වේ.

රාජ්‍ය අංශ මගින් ළමා සුභ සාධනය විවිධාකාරව ඉටු කරන අතරම ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැලැක්වීම ද එලෙසම ඉටු කළ යුතුය.ළමා අපයෝජන (child abuse) ළමා ශ්‍රමය (child labour) බඳු ශෝචනීය සමාජමය ගැටළු අද්‍යතන ලොව ගිලගෙන හමාරය.මෙමගින් ළමා වර්ධනයේ බිඳවැටීම් වීම ඒකාන්තය.ශාරීරික ,ලිංගික ,චිත්තවේගී අපයෝජන මෙන්ම ශ්‍රමය සූරා කෑම ,සන්නද්ධා හමුදාවලට බලහත්කාරයෙන් බඳවා ගැනීම ,ළමා සිඟිත්තන්ගේ අසරණ බව ,නීතිවිරෝධී කටයුතු සඳහා යොදවා ගැනීම් ආදිය රුදුරු ගැටළු වේ.එමෙන්ම නිසි පරිදි විධිමත් අධ්‍යාපනයක් ඒ ඒ ආයතනවලින් නොලැබීම ද දරුවාගේ අනාගතයට මරු පහරක් වන බව නොකිව මනාය.ඒ සඳහා වැඩිහිටි අය තම අයිතිවාසිකම් ලබා ගත යුත්තේ පළමුව තම යුතුකම් ඉටුකිරීම අත්‍යාවශ්‍ය වේ.

දරුවාට නිසි ලෙස තම ළමාවිය ගත කිරීමට නොහැකි වූ විට අත්වන භයානක ප්‍රතිඵල සමස්ත සමාජයට ඍජුවම බලපාන බව නොකිවමනාය. දරුවා නූගතෙකු වීම ඔහුගේ අනාගතය අඳුරට හෙළීමකි.සදාචාරාත්මක ,භාවාත්මක ,බුද්ධිමය හා ශාරීරික අංශයන් හානියට පත්වීම ,සෞඛ්‍යය පිරිහීම ආදියෙන් සමාජයට පිළිල වන පුද්ගලයන් බිහිවීම වැලැක්විය නොහැකිය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා ප්‍රඥප්තියට අනුව අවුරුදු 18ට අඩු අය ළමයින් සේ සැලකේ.මෑතකදී අවු.14ට අඩු අය මෙහෙකාර සේවයට නොයෙදීම ,සියළුදෙනාටම මූලික අධ්‍යාපනය සැලසීම වැනි ඉතා එලදායි පියවර ශ්‍රී ලංකාවේද ගනු ලැබුවේ ජාත්‍යන්තර සම්මුතින්ට එකඟවීමෙනි.
එක්සත් ජාතීන්ගේ සංවිධානයට වගකීමට රජය බැඳී සිටින නිසා අප රට මෑතකදී සිදු වූ හා සිදුවන ව්‍යසන වන වාර්ගික යුද්ධය ,සුනාමියෙන් වූ විපත ,මත් උවදුර ,සංචාරක උවදුර යනාදී ගැටළුවලට ද රජය පිළියම් යෙදීමට බැඳී සිටියි.නොඑසේ නම් මෙම උවදුරු හරහා අසරණ වන ළමා පරපුරේ හෙට දවස අවිනිශ්චය වේ.විවිධ රාජ්‍ය නොවන සංවිධාන (N.G.O) ලෙස විදේශීය ආධාර ද ලැබෙන අතර මේවායින් විපුල ඵල නෙලීමට සමාජයක් හෙට දවසේ සාර්ථකත්වය අපේක්ෂා කරන්නන් උත්සුක විය යුතුය.රටක ප්‍රගමනය යනු එහි වෙසෙන සමාජයේ ප්‍රගමනයයි.මේ සඳහා බුද්ධියෙන් ප්‍රබෝදමත් ,සාක්ෂරතාවයෙන් යුත් ,සදාචාරාත්මක වූ ගුණගරුක සමාජයක් බවට රටක පුරවැසියන් විසින් සැදුම් ලද යුතු වෙයි.නැතිනම් වංචා,දූෂණ ,මිනීමැරුම් ,අල්ලස් ,හොරකම් ආදිය ද පරිසර දූෂණය ,භෞතික හා මානව සම්පත් නාස්තිය ද අදට වඩා මහා පරිමාණයෙන් හෙට සිදු වනු ඇත.

මෙහිදී පුද්ගල සංවර්ධනය සඳහා වඩාත්ම බලපත්‍රයේ රටක අධ්‍යාපනයයි.මානව ස්ත්‍රීයත්වයේ පූර්ණ සංවර්ධනය හා එහි උදරත්වය පිළිබඳ හැඟීම කෙරෙහි අධ්‍යාපන ක්‍රමවේදය යොමුවීම අත්‍යාවශ්‍ය කරුණකි.භේද රහිතව ළමයාගේ උපරිම යහපත සලසමින් දෙමාපිය රැකවරණය යටතේ වර්ධනය වීමට සලසමින් ,නමක් ,ජාතියක් සහිත අනන්‍යතාවයක් ද සහිතව පවුලක සිටීමේ අයිතිය ඉතා වැදගත්ය.මෙම ළමා අයිතිවාසිකම් ඉටුවීමෙන් නිසි සේ සමාජානුයෝජනය (socialization) ක්‍රියාවලිය දිවිය පුරා බල පැවැත්වේ.මෙම සාරවත් පසුබිමෙන් බිහිවන බුද්ධිමතුන් සමාජය මනාව නිර්මාණය කරයි.

නමුත් වැදගත් ම කාර්යයභාරය වන්නේ සමාජ විරෝධී කණ්ඩායම් බිහිවීම වැලැක්වීමයි.
සරණාගත වී අනාථ ළමුන් ,ආබාධිත දරුවන් පවුලෙන් වෙන් වූ දරුවන් නීත්‍යානුකූලව භාරකාර රජයක් යටතේ පුනරුත්ථාපනය කොට සමාජයට මුදා හැරීම සමාජමය යුතුකමකි. භාෂාව ,චින්තනය ,ආගමික හා සමාගම් පැවැත්වීමේ නිදහස ,ක්‍රීඩා හා විනෝදාංශවල යෙදීමේ අයිතිය සංස්කෘතික කටයුතුවල නියැලීමේ අයිතිය සැමටම ලැබිය යුතුය.නිසි ගෞරවය දරුවාට දැක්වීමෙන් ඔහු ද ලොවට ගෞරව කරයි;ප්‍රිය කරයි.

"දිවි පැවැත්ම සඳහා ඉගෙනීම "අධ්‍යයන වාර්තාවෙන් පැහැදිලිවම දක්වන්නේ "ජීවිතයේ පළමු වසර හැර කාලය තුළ ඇතිවන මන්දපෝෂණය නිසා පාසලකට ඇතුලත් වන අවධිය වන විට දුබලතාවයට දරුවා පත්විය හැකි බවයි. ශ්‍රී ලංකාවේ ළදරු පාසල් දරුවන්ගෙන් 35% ක් මන්දපෝෂණයෙන් පෙළෙන බව එහි කියැවේ.මේ අනුව අධ්‍යාපනය මෙන්ම සෞඛ්‍යය ද අතිශයින් වැදගත්වන සාධකයක් වන්නේ නිරෝගී මනසක් හා කයක් තුළ පමණක් නිරෝගී පුද්ගලයාගේ නිසි පෞරුෂය තැනෙන බැවිනි.

දරුවා අයත්වන පවුල් පරිසරය හෝ ඔහු වැඩෙන සෙසු පරිසර ,සමාජීය ,සංස්කෘතික , ආර්ථික විවිධත්වයන් මත ඔවුන් ඇති වැඩිවන අයුරු ද පුද්ගලයෙකු නිර්මාණය වීමට දැඩි සේ බලපෑම් කරනු ලබයි.දැනුම ,කුසලතා හා ආකල්ප තුළින් බිහිවන පුරවැසියා සමාජයට එක්වන්නේ මේ විවිධත්වයන් අතරිනි.

බාල කාලයේ වැදගත්කම පිළිබඳ 1959 වසරේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කළ වාර්තාවක මෙසේ දැක්වේ.

"ළමයෙකුගේ පරිපූර්ණ වූද, ඒකරාශී වූද වර්ධනය සඳහා ඔහු ප්‍රීතිමත් වූද, ආදරයෙන් හා අවබෝධයෙන් යුතු වූද වාතාවරණයක් සහිත පවුල් වටපිටාවක ඇති දැඩි විය යුතුය "

1990 නිව්යෝක් නුවර රැස් වූ රටවල් 74 ක රාජ්‍ය නායකයින් ළමා පැවැත්ම සුරැකීම හා සංවර්ධනය පිළිබඳ ලෝක ප්‍රකාශනයට අත්සන් තැබූහ. මානව ශිෂ්ඨාචාරයේ මුල් වරට වූ සුභ සිද්ධියක් වූ මේ ප්‍රකාශනයේ අභිලාෂය වනුයේ "සිඟිති වියේ සැම දරුවෙකුටම යහපත් අනාගතයක් හිමිකර දීමයි.එසේම සැම ළමයෙකුටම මිහිරි ,සොඳුරු කෙළිදෙලෙන් ,සතුටින් හා ඉගෙනුමෙන් ගත කිරීමට ඉඩ සැලසිය යුතු බවට" ප්‍රකාශනයේ සඳහන් වේ.මෙහිදී සමාජානුයෝජනයට අත්‍යවශ්‍ය වනුයේ සමාජ විනිශ්චයන් (Social Judgement) හා ආත්ම දමනයන්ය. (Self-Control) උපදේශනය හා මාර්ගෝපදේශනය සැලස්වීම දරුවාගේ හෙට දවස දීප්තිමත් කරන සාධකයන්ය.මෙනයින් බලන කල වැඩිහිටියන්ගේත් සමස්ත සමාජයේත් ,රජයේත් වගකීම සමාජ ප්‍රගමනයට උරදීමයි.ඒ සඳහා අප අගනාම සම්පත වන ළමා පරපුරට අයිතිවාසිකම් ලබා දී යුතුකම් ඉටු කළ යුතුය.එවිට හෙට "එතරම් කළුවර නැති වනු ඇත"

## ආශ්‍රිත ග්‍රන්ථ

1)'අධ්‍යාපනය 'විජ්හ්ජ්ක්ස් වාර්තාව - කැරෙල් බෙලම් (1991)

2) සිනාසෙන බිළිඳු විය - මාර්නා බිලවුන්ට්

3) our children and future - එම්. මාග්‍රට්

4) ළමා මනෝවිද්‍යාව - දයා රෝහණ අතුකෝරළ

ඉදිරිපත් කිරීම - දිල්රුකා ඇරැගොඩ

(පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශය මගින් පැවැත් වූ මානව හිමිකම් සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමේදී ඉදිරිපත් කළ ශාස්ත්‍රීය ලිපිය)

## 49. Importance of using visual aid for the teaching of English in primary classes

**"If hear I forget**

**If I see, I remember**

**If I do I know "and**

**"A picture is worth a thousand words "**

These are sufficient to prove the importance of using Visual aid to inculcate concepts in child's mind. The great writers on educational theory **Plato**, **Rousseau, Mill, Dewy** and **Gandhi** emphasized that the **book should be used as a last resort. "Teach by doing where you can…. I hate books, they only teach us to talk about things we know nothing about…. "**Rousseau emphasized that idea. T.W. Moore concluding his review of Rousseau's theory on education says "…………. Education should keep to the nature of children with the child, on the widening of his experience, on the exploration of his environment, on the satisfaction of his environment, on the satisfaction of his present needs and interests. Child is to be concerned with things rather than with words with the concrete world around him rather than with books and formalized knowledge.

Visual aid, when properly used, is helpful and their value in the primary classroom is undisputed. They improve the effectiveness of the teaching done and make learning easier and more enjoyable visual aid can be exciting and stimulating part of language teaching and learning.

The best aid in any school is the "teacher "when aids are used successfully practice in their use, this is where a teacher plays an important role and the most important aid after the teacher is the blackboard and it is to be found in all schools. It must be used not only for teaching reading and writing but also for illustrating. A great deal can be taught through the use of simple line drawings. You do not have to be an artist to create colourful, useful visual aid for your students.

Especially in the primary classes, visual aids are essential in activating the teaching process where the child's home background has provided only very limited experience or no experience at all as far as exposure have to be provided in the school. This is where visual aid plays an important role, to motivate them to add variety and to give opportunity for the creative use of language. Some of the basic visual aid a teacher teaching English in Primary Classes should have in her "Teacher's kit "are mentioned below. Here are some ideas for how to use readily available materials for visual aid. It will also include ideas for different kinds of visual aid and how they may be used to enchant English lesson.

**1. A picture file**

Collect pictures from newspapers, magazines, greeting cards, calendars etc. These pictures may be used for various purposes.

**2. A visual aid collection box**

Bring a large box to school and encourage your students to bring in items such as: Scraps of clothes, empty cardboard boxes, tins, plastic bottles, bottle caps and labels.

**3. A collection of newspapers**

Newspapers can be a limitless source of lesson material. If you start to collect various items. You can make a library of supplementary material for use. When you are absent or for advanced students who want extra work. Your collection may be stored in files. Crossword puzzles, advertisements, headlines, articles etc.

**4. Flash cards**

(To facilitate recognition of words and sentences)

**5. A clock face**

To read the time and numbers

**6. A lexicon set per child for spelling exercise**

**7. Pictures and sentences for matching exercises**

**8. Self-matching cards for recognition and matching**

**9. A flannel board**

**10. A class calendar**

**11. Nursery rhymes illustrated**

**12. Scrap books**

**13. Handmade books**

(To teach the alphabet, shapes, colours, fruits, vegetables, animals, verbs, songs, poems, games etc.)

**14. Puppets**

(Stick puppets, finger puppets, hand puppets)

**15. A magic bag full of various offs and ends to teach vocabulary**

**16. A tray filled with sand and cutouts of figures and objects related to them**

**17. Maps and charts**

**18. Masks**

These can be used to stimulate conversation, to teach sentence patterns or to depict common emotional responses and states of mind; surprise, anger etc.

**19. Diary to write daily happening in**

**20. A bag to hold some of the visual aids in daily use**

(An empty polythene bag strips of cloth sewn across to form pockets)

Now in this modern world teachers can make learning a joyful experience for children by using video and audio programmes such as films, songs, action rhymes etc.
Teachers can hold exhibitions to show the importance of using visual aid for the teaching English in primary classes.

English is an important subject in primary curriculum today. So as teachers, we should try our best to make success in the teaching learning process.

W.M.Dilruka Eragoda

(Eng. Trained, B (ed) Primary)

K/ Kirinda Vidyalaya,

Gampola.

ගුරු ගෙදර මගින් සදදියමංකඩ දීප ව්‍යාප්ත ගුරු විදුහල්පති කාව්‍ය නිර්මාණ තරගාවලියෙන් කුසලතා සම්මානයක් හිමි වූ නිර්මාණය - 2024

## 50. ඇඳුරු සිතක මහිම

ගසක වැල් එතී සසැලෙන දසුන මනහරයි
ගසට උරුම සවිය වැලට නැති බවක් සැබැයි
දිනෙක වැලේ පිපි කුසුමෙන් තුරු හිස් සොඳුරුයි
දිරි දෙන ගුරුවරු තුරුමය සිසුන් වැල් සමයි

නාය යද්දි ගුණ නැණ තොර දරුවෙකුගේ මන
සාප නොකර මෙත් මුදුතාවෙන් වීරිය ගෙන
ඉමක් නොදුන සරුංගෝල විලසින් පාවෙන
දරුන්ට නිසි මග පෙන්වන ගුරුන්ය අපමණ

රුදු අවි ලෝ වනසන සඳ ගුරු හද සසලයි
නිසරු සිතුම් දුරැර නිමල දරුමල් සනසයි
ඉසි කෝමන් තොර සිත සෙත් පිරිතකට සමයි
හිස අත හදවත සරුකොට දෙස පණ නංවයි

මවා ගිරග චන්දන සිසිලස පාරාදීසේ
නිවා තාප සෝ ළතැවුල් සරතැස සත්තානේ
රාව නැගේ මියුරු සකුණු මියැසි සේ ප්‍රභාතේ
පාව ඇදේ ඇඳුරු තෙපුල් දරුහිත් මල් යායේ

දෑයේ ඉටු දෙවිඳු විලසින් සදාකල් දිනේවා
රැයේ සඳු සේම තිමිරය සදා දුරු කෙරේවා
අඳුර දුරලනා අරුතින් ගුරු තරු බිහිවේවා
සසර පුරා සුවඳ සදන ගුරු සිත් පිබිදේවා

ගේය පද සංකල්පනය - දිල්රුකා ඇරැගොඩ මිය
මහාමායා බාලිකා විදුහල, මහනුවර.

# පසුවදන



දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ
සහකාර විදුහල්පතිනිය *(ශ්‍රී.ලං.වි.සේ.1)*
***(BA, Bed, PGDEM, Eng. Trained)***
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමී ව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සම ව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මක ව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසා ය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලමෙතුමන් ඇතුළු දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)